පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක: 492

ආයතනයේ නම: **සබරගමුව පළාත් සභාව යටතේ වූ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන**
පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා
සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ
හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

பாராளுமன்ற வெளியீட்டுத் தொடர் இலக்கம்: 492
நிறுவனத்தின் பெயர் : சபரகமுவ மாகாண சபையின் கீழ் உள்ள அமைச்சுக்கள் , திணைக்களங்கள், அதிகார சபைகள்

பாராளுமன்றத்தின் அரச கணக்குக் குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 119(4) இன் கீழ் கௌரவ அமைச்சரின் அவதானிப்புக்களும் மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளும் பாராளுமன்றத்திற்கு சமர்பித்தல்.

Parliamentary Series No. - 492

Name of the Institution: Ministries, Departments and Statutory Authorities under the Sabaragamuwa Provincial Council
Submission of observations of Hon. Minister and steps taken with regard to the reports tabled by the Committee on public Accounts in terms of standing order No.119(4)

සබරගමුව පළාත් සභාවේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනවල

මූල්‍ය අනුකූලතාවය සහ මෙහෙයුම් කාර්ය සාධනය පිළිබඳ

මාර්ගගත තොරතුරු කළමනාකරණ පද්ධතිය මගින් ඇගයීම 2023 මුදල් වර්ෂය

(පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා 492)

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා 492 පිටු අංකය	වාර්තාවෙන් හඳුනාගෙන ඇති අඩුපාඩු	අඩුපාඩු නිවැරදි කිරීමට ආයතනය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග / වත්මන් තත්ත්වය
	ආයතනයේ නම : සබරගමුව පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව	
239	ස්ථාවර වත්කම් ලේඛනය නිසි පරිදි යාවත්කාලීනව පවත්වා නැත.	ස්ථාවර වත්කම් ලේඛනයක් වෙනුවට, CIGAS වැඩසටහන මඟින් ස්ථාවර වත්කම් ගොනුවක් පවත්වාගෙන යනු ලැබේ
	මූල්‍ය බලතල පැවරීම ආයතනය තුල විධිමත්ව සන්නිවේදනය කර නොතිබුණි	බලතල පැවරීම සිදුකර බලතල පිළිබඳ සන්නිවේදනය කිරීමට කටයුතු කර ඇත.
	2004.5.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව රජයේ වැටුප් සකස් කිරීමේ පරිගණක මෘදුකාංගයට අදාළ මුරපද තුන්මසකට වරක් වෙනස් කර නොතිබුණි.	වැටුප් සකස් කිරීමේ පරිගණක මෘදුකාංගයට අදාල මුරපද තුන්මසකට වරක් වෙනස් කිරීමට කටයුතු කිරීම
	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි	2025 වර්ෂයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර අනුමැතියට ඉදිරිපත් කර ඇත
	අක් මුදල් ඉල්ලුම් පත්‍රය නියමිත දිනට නියමිත පරිදි ඉදිරිපත් කර නොතිබුණි	මේ සම්බන්ධයෙන් නිලධාරීන් දැණුවත් කර ඇත. නියමිත දිනට නියමිත පරිදි අක් මුදල් ඉල්ලුම් කිරීම සිදුකර ඇත .
	විගණකාධිපති විමසා අභ්‍යන්තර	මේ සම්බන්ධයෙන් උපදෙස් විමසා කටයුතු කිරීමට පියවර ගනිමි

	විගණන වැඩසටහන වර්ෂය ආරම්භයේ දී පිළියෙල කර නොතිබුණි.	
	මසක් තුළ අභ්‍යන්තර විගණන විමසුම් සඳහා පිළිතුරු නොසැපයූ අවස්ථා නිරීක්ෂණය විය.	රෝහල් වලට අදාල විගණන විමසුම් ලැබීමේදී රෝහලට යොමුකර පිලිතුරු ලබාගෙන එම පිළිතුරේ නිවැරදිභාවය සම්බන්ධයෙන් ආයතන අංශය සහ සංවර්ධන අංශය මඟින් තහවුරු කර ඉන් අනතුරුව පිළිතුරු සැපයීම සිදු කරන බැවින් ඇතැම් අවස්ථාවල මෙලෙස ප්‍රමාදවීම් සිදුවේ. කඩිනමින් ඉදිරිපත් කිරීමට කටයුතු කරමි.
	සමාලෝචිත වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණ පවත්වා ඒවායේ වාර්තා පළාත් මූල්‍ය රීති ප්‍රකාරව විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	2023 වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර අවසන්ව ඇත. 2025 වර්ෂයේ සිට විගණකාධිපති වෙත අදාල වාර්තා නියමිත දින ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත.
	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්තතා, ඌනතා පිළිබඳ වන නිර්දේශ ද අනෙකුත් නිර්දේශ ද නියමිත කාල වකවානු තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.	රෝහල් සහ මධ්‍යම බෙහෙත් ශාලා සියල්ලගේම භාණ්ඩ සමීක්ෂණ කටයුතු නිර්දේශිත දිනට ඉදිරිපත් කිරීම ප්‍රායෝගිකව සිදුකිරීම අපහසු වේ. හැකි සෑමවිටම නියමිත දිනට ඉදිරිපත් කිරීමට කටයුතු කරමි.
	සෑම වාහනයක් සඳහාම ලොග් පොත් යාවත්කාලීන පදනමක් මත පවත්වා නොතිබුණි	සෑම වාහනයක් සඳහාම ඇති ලොග් සටහන් පොත් මේ වන විට නිසි අයුරින් යාවත්කාලීන කරමින් පවත්වාගෙන යනු ලබයි.
	බැංකු සැසඳුම් ප්‍රකාශ නියමිත දිනයට පිළියෙල කර සහතික කර විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.	බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර නියමිත දිනට ඉදිරිපත් කර ඇත.

	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මු.රෙ.ප්‍රකාරව මසක් තුළ නිරවුල් කර නොතිබුණි.	බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර නියමිත දිනට ඉදිරිපත් කර ඇත.
	පළාත් මූල්‍ය රීති ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිම වී දින 14ක් ඇතුළත නිරවුල් කර නොතිබුණි.	තත්කාර්ය අතුරු අග්‍රිම කාර්යය නිමවී දින 14ක් ඇතුළත නිරවුල් කිරීමට ප්‍රායෝගිකව නොහැකි වූ අවස්ථාවන් තිබුණ ද හැකි සෑම අවස්ථාවකදීම දින 14ක් ඇතුලත දී නිරවුල් කර ඇත.
	සමාලෝචිත වර්ෂය තුළ විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් නියමිත පරිදි පවත්වා නොතිබුණි.	2025 වර්ෂයේ සිට විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් නියමිත පරිදි පැවැත්වීමට කටයුතු කර ඇත.
	සියලු නිලධාරින් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි.	2024 වර්ෂයේ සිට වත්කම් බැරකම් ප්‍රකාශ ලබා ගැනීමට අවශ්‍ය කටයුතු කරන ලදී.
	වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් නොකළ අදාල නිලධාරීන් පිළබඳව ආයතන ප්‍රධානියා විසින් උචිත බලධරයා දැනුවත් කර නොතිබුණි.	2024 වර්ෂයේ සිට වත්කම් බැරකම් ප්‍රකාශ ලබා ගැනීමට අවශ්‍ය කටයුතු කරන ලදී.
	ආයතනය පිළිබඳව මහජනයාට අවශ්‍ය තොරතුරු ලබාදීම සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කර පවත්වාගෙන ගොස් නොතිබුණි.	2026 වර්ෂයේ සංශෝධිත PSDG සැළැස්ම යටතේ එම කාර්යය ඇතුළත් කර ඉටු කර ගැනීමට අපේක්ෂිතය.
	ආයතනයේ පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවිය මගින් මහජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දී නොතිබුණි.	2026 වර්ෂයේ සංශෝධිත PSDG සැළැස්ම යටතේ එම කාර්යය ඇතුළත් කර ඉටු කර ගැනීමට අපේක්ෂිතය.

	ආයතනයේ පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය කිරීමට සහ ඇඟයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.	ආයතන ප්‍රධානියාගේ සෘජු අධීක්ෂණය යටතේ හා අනෙකුත් මාණ්ඩලික නිළධාරීන්ගේ උපදෙස් යටතේ මෙය පවත්වා ගෙන යනු ලැබේ. ආයතනයේ නිලධාරීන්ගේ කාර්ය සාධනයේදී මේ පිළිබඳව සැළකිලිමත් වේ.
	2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.	2025 වර්ෂයේ මානව සම්පත් සැලැස්ම සකස් කර ඇත.
	සකස් කරන ලද මානව සම්පත් සැළැස්ම මඟින් කාර්ය මණ්ඩලයෙන් සියයට 50 කට වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් සහතික කර නොතිබුණි	2024 වර්ෂයේ PSDG සැලැස්ම යටතේ ප්‍රතිපාදන වෙන්ව පැවති පුහුණු වැඩසටහන් 06න් 05ක් ද, 2025 වර්ෂයේ PSDG සැලැස්ම යටතේ ප්‍රතිපාදන වෙන්ව පැවති පුහුණු වැඩසටහන් 08න් 08 ද, පවත්වා ඇති අතර 2026 වර්ෂයේ PSDG සැලැස්ම යටතේ පුහුණු වැඩසටහන් සඳහා වෙන්ව පවතින ප්‍රතිපාදන මඟින් මේ වන විට පුහුණු වැඩසටහන් ආරම්භ කර ඇත.
	සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව නොතිබුණි	මේ පිළිබඳව අවධානය යොමු කර ඉදිරියේදී සකස් කිරීමට පියවර ගනිමින් පවතී.
	මානව සම්පත් සංවර්ධන සැලසුම් සකස් කිරීමට ද ධාරිතා හා නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ආයතනය තුළ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු නම් කර නොතිබුණි.	සැලැස්මට අදාල පුහුණු වැඩසටහන්, ආයතන ප්‍රධානියාගේ හා අනෙකුත් මාණ්ඩලික නිළධාරීන්ගේ අධීක්ෂණය යටතේ පවත්වා ගෙන යනු ලැබේ.

	සැලසුම් ගත පුහුණු අවස්ථා වලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% ට වඩා අඩු මට්ටමක පැවතුණි.	2026 වර්ෂය දක්වා සකස් කර ඇති මානව සංවර්ධන සැලැස්ම තුළ එක් එක් වැටුප් කේත අනුව පුහුණු අවස්ථා ඇතුළත් කර ඇත. තව ද සබරගමුව පළාත් සභාව මඟින් සැලසුම් කරනු ලබන පුහුණු වැඩසටහන් සඳහා ද නිළධාරින් අදාල පරිදි යොමු කරනු ලැබේ.
	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය යටත්ව මට්ටමේ / ව්‍යාවන මට්ටමේ / අභිතකර මට්ටමේ විය.	හදුනාගත් අඩුපාඩු නිවැරදි කරමින් පවතී.
239	**ආයතනයේ නම: පළාත් සත්ත්ව නිෂ්පාදන දෙපාර්තමේන්තුව**	
	තැන්පතු සඳහා සැසැදුම් ප්‍රකාශය නියමිත දිනට ඉදිරිපත් කර නැත.	ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි.
	උප පත්‍රිකා පොත් ලේඛනය නිසි පරිදි යාවත්කාලීනව පවත්වා නොතිබිණි.	වර්තමානයේ යවත්කාලීනව පවත්වාගෙන යනු ලැබේ
	2004/05/11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව රජයේ වැටුප් සකස් කිරීමේ පරිගණක මෘදුකාංගයට අදාළ මුරපද තුන්මසකට වරක් වෙනස් කර නොතිබුණි.	2023 වර්ෂයේ වැටුප් සකස් කරන මෘදුකාංගයේ මුරපදය වෙනස් කිරීම අතපසු වී තිබූ අතර මේ වන විට තුන්මසකට වරක් නව මුරපද ලබාදෙමින් වැටුප් මෘදුකාංගය ආරක්ෂිතව පවත්වාගෙන යන බව කාරුණිකව දන්වමි
	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි.	මේ වන විට වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම නියමිත දිනට සකස් කර අවසන් කරනු ලැබේ.
	මසක් තුළ අභ්‍යන්තර විගණන	ප්‍රාදේශීය කාර්යාල මගින් ගෙන්වා ගනු ලබන විගණන විමසුම් පළාත්

	විමසුම් සඳහා පිළිතුරු නොසැපයූ අවස්ථා නිරීක්ෂණය විය.	කාර්යාලයේදී නැවත සංශෝධනය කිරීමත් සිදුවන බැවින් මසකට වඩා වැඩි කාලයක් ගත වේ.
	සංචිත වාහන දෛනික ධාවන කාලසටහන් හා මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	මේ වන විට නියෝජ්‍ය අධ්‍යක්ෂ කාර්යාල හරහා දෛනික ධාවන සටහන් විගණකාධිපති වෙත ඉදිරිපත් කරනු ලැබේ.
	වාහනයක් ගර්හිත වී මාස 8 වඩා අඩු කාලයකදි අපහරණය කර නොතිබුණි.	දැනට මෙම වාහනයේ කටයුතු අවසන් කර එම වාහනය වෙන්දේසි කර ඇත.
	පළාත් මූල්‍ය රීති ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිම වී දින 14ක් ඇතුළත නිරවුල් කර නොතිබුණි.	අවශ්‍ය නිලධාරීන් දැනුවත් කරමින් ,නිවැරදිව නිරවුල් කිරීමට කටයුතු ආරම්භ කර ඇත
	අනුමත අග්‍රිම ගිණුම් ශේෂ පළාත් භාණ්ඩාගාරයේ පොත් සමඟ කාර්තුමය වශයෙන් සසඳනු ලබන අක් මුදල් සැසඳුම් ප්‍රකාශය නියමිත දිනට පෙර පළාත් භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කර නොතිබුණි.	ඉදිරියේදි නිවැරදිව කිරීමට කටයුතු සලසමි.
	අක්මුදල් සැසැඳුම් ප්‍රකාශය අනුව අනාවරණය වී තිබුණු වෙනස්කම් හඳුනාගෙන ඒවා නිවැරදි කිරීමට පියවර ගෙන නොතිබුණි.	ඉදිරියේදි නිවැරදිව කිරීමට කටයුතු සලසමි
	විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම මසකට වඩා වැඩි කාලයකට ප්‍රමාද කිරීම් නිරීක්ෂණය විය.	උප කාර්යාල මගින් පිළිතුරු ගෙන්වාගෙන ඉදිරිපත් කල යුතු බැවින් යම් කාලයක් ප්‍රමාද වේ .ඉදිරියේදී එම ප්‍රමාදයන් වලක්වා ගැනීමට කටයුතු කරමි.

	සමාලෝචිත වර්ෂය තුළ විගණන හා කළමණාකරණ කමිටුවේ රැස්වීම නියමිත පරිදි පවත්වා නොතිබුණි.	2023 තුන්වන කාර්තුවේදී දෙපාර්තමේන්තු විගණන කළමනාකරණ කමිටු පැවැත්වීම ආරම්භ කරන ලදී. ඉන්පසු නොකඩවා කාර්තු 4 සඳහාම රැස්වීම් වාර පවත්වනු ලැබේ.
	සියලු නිලධාරීන් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි.	දැනට වත්කම් බැරකම් ප්‍රකාශ ලබා දිය යුතු නිළධාරීන් සියළු දෙනා එම ප්‍රකාශ මෙ වන විට ලබා දී අවසන් කර ඇත.
	වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් නොකළ අදාළ නිලධාරීන් පිළිබඳව ආයතන ප්‍රධානියා විසින් උචිත බලධරයා දැනුවත් කර නොතිබුණි.	වත්කම් බැරකම් ප්‍රකාශ ලබාදීම ප්‍රමාද නිළධාරීන් සම්බන්ධව අදාල බලධාරීන් දැනුවත් කර ඇත.
	ආයතනය පිළිබඳව මහජනයාට අවශ්‍ය තොරතුරු ලබාදීම සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කර පවත්වාගෙන ගොස් නොතිබුණි.	දෙපාර්තමේන්තුව සතුව වෙබ් අඩවියක් නොමැති අතර ,අමාත්‍යාංශ වෙබ් අඩවිය තුළ අපගේ විස්තර ද පළකර ඇත.
	ආයතනයේ පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවිය මගින් මහජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව සලසා දී නොතිබුණි.	දෙපාර්තමේන්තුව සතුව වෙබ් අඩවියක් නොමැති අතර ,අමාත්‍යාංශ වෙබ් අඩවිය තුළ අපගේ විස්තර ද පළකර ඇත.
	ආයතනයේ පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය කිරීමට සහ ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.	ඉදිරියේදී මේ සඳහා නිළධාරියෙකු පත් කරනු ලැබේ.
	සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවතුණි.	2023 වර්ෂයේ පුහුණු සැලැස්මට අනුව වැඩමුළු පැවැත්වීම 50% කටත් වඩා අඩු ප්‍රතිශතයක් පැවතුන ද, 2024 වර්ෂයේ පුහුණු වැඩසටහන් පැවැත්වීමේ ප්‍රතිශතය 55% ක් හා 2025 වර්ෂයේ පුහුණු වැඩසටහන් පැවැත්වීම50% ක් වන බව ද දන්වමි.

	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය,යටත්ව මට්ටමේ/ව්‍යාජන මට්ටමේ/අහිතකර මට්ටමේ විය.	තත්වාගණනය කළ මතය විය
240	**ආයතනයේ නම : පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව**	
	භානි පිළිබඳ ලේඛනය නිසි පරිදි යාවත්කාලීනව පවත්වා නොතිබුණි	වර්තමානයේ යාවත්කාලීන කර පවත්වාගෙන යෑම සිදුකරයි.
	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබිණි	ක්‍රියාකාරී සැලැස්ම සෑම වර්ෂයකම පිළියෙල කර ඇත
	අක්මුදල් ඉල්ලුම්පත්‍රය නියමිත දිනයට නියමිත පරිදි ඉදිරිපත් කර නොතිබිණි.	වර්තමානයේ නියමිත දිනට ඉදිරිපත් කරයි.
	මසක් තුළ අභ්‍යන්තර විගණන විමසුම් සඳහා පිළිතුරු නොසැපයූ අවස්ථා නිරීක්ෂණය විය.	උප කාර්යාල වලින් පිළිතුරු ගෙන්වා ගැනීමේ දී මෙම තත්වය පැන නගින අතර මේ වනවිට හැකි ඉක්මනින් ගෙන්වා ගෙන පිළිතුරු සැපයීම සිදුකරයි.
	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	මේ වනවිට නියමිත පරිදි ධාවන සටහන් හා මාසික සාරාංශ යොමු කරයි.
	සෑම වාහනයක් සඳහාම ලොග් පොත් යාවත්කාලීන පදනමක් මත පවත්වා නොතිබුණි.	වර්තමානයේ යාවත්කාලීන කර පවත්වාගෙන යෑම සිදුකරයි.
	බැංකු සැසඳුම් ප්‍රකාශවලින්	වර්තමානයේ නිරවුල් කිරීම් කටයුතු හැකි ඉක්මනින් සිදු කරයි.

	අනාවරණය වූ ගැලැපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධනයෙන් මු.රෙ. ප්‍රකාරව මසක් තුළ නිරවුල් කර නොතිබුණි.	
	පළාත් මූල්‍ය රීති ප්‍රකාරව නිකුත් කල තත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිම වී දින 14 ක් ඇතුළත නිරවුල් කර නොතිබුණි.	මේ වනවිට නියමිත පරිදි අත්තිකාරම් පියවීම සිදු කරයි.
	අනුමත අග්‍රිම ගිණුම් ශේෂ පළාත් භාණ්ඩාගාරයේ පොත් සමඟ කාර්තුමය වශයෙන් සසඳනු ලබන අක්මුදල් ප්‍රකාශය නියමිත දිනට පෙර පළාත් භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කර නොතිබුණි	සැසඳුම් ප්‍රකාශය නියමිත දිනට පළාත් භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කරීම සිදුකරයි.
	සමාලෝචිත වර්ෂය තුල විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් නියමිත පරිදි පවත්වා නොතිබුණි.	වර්තමානයේ සෑම කාර්තුවකටම අදාල කමිටු රැස්වීම් පවත්වාගෙන යෑම සිදුකරයි
	මු.රෙ.94(1) ප්‍රකාරව වැය විෂයකට සලසා තිබූණ ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂය අවසානයට ඉතිරි වූ ප්‍රතිපාදන සීමාව ඉක්මවන පරිදි බැරකම් වලට එළඹ තිබුණි	මෙම වර්ෂයේ සිට පවතින ප්‍රතිපාදනය තුල වියදම් පවත්වාගෙන යෑමට කටයුතු කරනු ලැබේ.
	ඇතැම් වැය විෂයන් සඳහා සලසා තිබූ මුළු ප්‍රතිපාදනයම ඉතිරි කර තිබූ අවස්ථා නිරීක්ෂණය විය.	ඇස්තමේන්තු සකස් කිරීමේදී නිවැරදි දත්ත හා තොරතුරු අනුව සකස් කිරීම සිදු කිරීමට උපදෙස් දෙන ලදී.
	අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩල බඳවාගෙන තිබුණි.	පළාත් සභා අනුමත කාර්ය මණ්ඩලය තුළ බඳවා ගත් නිලධාරීන් සේවා අවශ්‍යතාවය මත මෙම ආයතනයට අනුයුක්ත කර ඇත

	සියලු නිලධාරීන් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි.	මේ වනවිට සියළු නිලධාරීන් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කරනු ලැබේ.
	වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් නොකළ අදාල නිලධාරීන් පිළිබඳව ආයතන ප්‍රධානියා විසින් උචිත බලධරයා දැනුවත් කර නොතිබුණි.	මේ වනවිට සියළු නිලධාරීන් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කරනු ලැබේ.
	ආයතනය පිළිබඳ මහජනයාට අවශ්‍ය තොරතුරු ලබාදීම සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කර පවත්වාගෙන ගොස් නොතිබුණි. ආයතනයේ පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවිය මගින් මහජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දී නොතිබුණි.	වෙබ් අඩවිය අමාත්‍යාංශය මගින් පවත්වාගෙන යෑම සිදුකරයි. දෙපාර්තමේන්තුව මගින් වෙබ් අඩවියක් නිර්මාණය කිරීම සිදුකරමින් පවතින අතර එහි මහජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දීමට කටයුතු සිදුකරයි.
	විගණකාධිපති වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.	වර්තමානයේ විගණකාධිපති වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සිදු කරයි

241	**ආයතනයේ නම : පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**	
	හානි පිළිබඳ ලේඛනය නිසි පරිදි යාවත්කාලීන පවත්වා නොතිබුණි.	හානි පාඩු ලේඛණය යාවත්කාලීණ කිරීමට උපදෙස් ලබා දී ඇත
	2004.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව රජයේ වැටුප් සකස් කිරීමේ පරිගණක මෘදුකාංගයට අදාල මුරපද තුන්මසකට වරක් වෙනස් කර නොතිබුණි.	2026 වර්ෂය වන විට පරිගණක මෘදුකාංගයට අදාල මුරපද මාස තුනකට වරක් වෙනස් කරමින් සිටියි.
	මසක් තුළ අභ්‍යන්තර විගණන විමසුම් සඳහා පිළිතුරු නොසැපයූ අවස්ථා නිරීක්ෂණය විය	විගණන විමසුමක් ලද විට කලාප කාර්යාලයට යොමු කරන අතර කලාප කාර්යාල විසින් අදාල විදුහලට යවනු ලබයි. විදුහල විසින් පිළිතුරු සකස් කර කලාප කාර්යාලය වෙත යොමුකරන අතර කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකගේ නිර්දේශ ලබාගෙන මම විසින්ද සංශෝධනය කර අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කරන බැවින් මසක කාලයක් ඉක්මවීමක් සිදුවේ.මෙම තත්වය මේවන විටත් පවතී.
	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත,ඌනතා,පිළිබඳව වන නිර්දේශද අනෙකුත් නිර්දේශද නියමිත කාල වකවානු වල /වාරක්‍රියාත්මක කර නොතිබුණි.	පාසල් පද්ධතිය තුල භාණ්ඩ සමීක්ෂණ වලින් අනාවරණය වන පරීක්ෂණ වලට අමතරව වෙනත් පරීක්ෂණ විශාල ප්‍රමාණයක් පවතී. මෙම සියළුම පරීක්ෂණ සිදුකරනු ලබන්නේ මාණ්ඩලික නිළධාරීන් විසිනි. 2025 දෙසැම්බර් මස දක්වා මාණ්ඩලික නිළධාරීන්ගේ විශාල අඩුවක් පැවතුන අතර මේවන විට පුරප්පාඩු වලින් වැඩි ප්‍රමාණයක් සම්පූර්ණ වී ඇත. එබැවින් ප්‍රමාද වී පවතින පරීක්ෂණ කඩිනමින් සිදුකිරීමට පියවර ගනිමින් සිටියි.
	සෑම වාහනයක් සඳහාම ලොග් පොත්	වාහන වල ලොග් පොත් යාවත් කාලීන කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත.

	යාවත්කාලීන පදනමක් මත පවත්වා නොතිබුණි.	
	විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම මාසකට වඩා වැඩි කාලයකට ප්‍රමාද කිරීම් නිරීක්ෂණය විය.	විගණන විමසුමක් ලද විට කලාප කාර්යාලයට යොමු කරන අතර කලාප කාර්යාල විසින් අදාල විදුහලට යවනු ලබයි. විදුහල විසින් පිළිතුරු සකස් කර කලාප කාර්යාලය වෙත යොමුකරන අතර කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකගේ නිර්දේශ ලබාගෙන මම විසින්ද සංශෝධනය කර අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කරන බැවින් මසක කාලයක් ඉක්මවීමක් සිදුවේ.මෙම තත්වය මේවන විටත් පවතී.
	වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.	මෙ වන විට හිඟ ණය ශේෂ කලාප මට්ටමින් නිරවුල් කිරීමට කටයුතු කරමින් පවතී.
	සියලුම නිලධාරින් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි.	2025.03.31 දිනට අදාලව වත්කම් බැරකම් ඉදිරිපත් කල යුතු සියළුම නිළධාරීන් 2025.06.30 වන විට වත්කම් බැරකම් ප්‍රකාශ ලබා දීමට කටයුතු කර ඇත.
	අංක 2/2018 දරණ රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛයේ විධි විධාන අනුව එහි නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.	2027 වර්ෂයේ සිට සැලසුම් සකස් කිරීමට පියවර ගනිමින් සිටියි.
	සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මඟින් කාර්ය මණ්ඩලයේ 50% වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයෙන් පැය 12 නොඅඩු පුහුණු අවස්ථාවක් සහතික කර නොතිබුණි.	2027 සැලසුම් සකස් කිරීමේදී ඒ පිළිබඳ කටයුතු කිරිමට අපේක්ෂා කෙරේ.
	සමස්ත කාර්ය මණ්ඩලයට ඇතුලත්ව කාර්ය සාධන ගිවිසුම් සකස්කර ගිවිසුම් ගත කර නොතිබුණි.	2027 වර්ෂයේ සිට ගිවිසුම් ගත වීම ආරම්භ කිරීමට අපේක්ෂා කෙරේ.

	මානව සම්පත් සංවර්ධන සැලැසුම් සකස් කිරීමටද ධාරිතා සහ නිපුනතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ආයතනය තුළ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු නම් කර නොතිබුණි.	2027 වර්ෂයේදී නිළධාරියෙකු නම් කිරීමට කටයුතු යොදා ඇත.
	සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබාදී තිබූ පුහුනු අවස්ථා ප්‍රමාණය 50% ට වඩා අඩු මට්ටමක පැවතුණි.	2027 සැලසුම් සකස් කිරීමේදී ඒ පිළිබඳ ක්‍රියා කිරීමට කටයුතු යොදා ඇත .
	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය යටත්ව මට්ටමේ/ව්‍යාවන මට්ටමේ/අහිතකර මට්ටමේ විය.	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය යටත්ව මට්ටමේ විය.
241	**ආයතනයේ නම : පළාත් පාලන දෙපාර්තමේන්තුව**	
	2004.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍ර ලේඛය ප්‍රකාරව රජයේ වැටුප් සකස් කිරීමේ පරිගණක මෘදුකාංගයට අදාල මුරපද තුන්මසකට වරක් වෙනස් කර නොතිබුනි	2023 වර්ෂයේ වැටුප් සැකසීමේ මෘදුකාංගයේ මුරපදය වෙනස් කර ඇත. වර්තමානයේ මුරපදය වෙනස් කිරීම මඟින් ඉදිරියට වැඩ කටයුතු සිදු කරමි.
	පලාත් මූල්‍ය රීති ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුනි	ඉදිරියේදි කටයුතු කරමි.
	සංචිත වාහන සදහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුනි	ධාවන සටහන් මාසිකව ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත. මාසිකව විගණකාධිපති වෙත දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා ඉදිරිපත් කර ඇත
	ඇතැම් වැය විෂයන් සදහා සලසා තිබූ මුළු ප්‍රතිපාදනයම ඉතිරි කර තිබූ අවස්ථා නිරීක්ෂණය විය	ඉන්ධන මිල පුරෝකතනය වෙළඳපල උද්ධමනය හේතුවෙන් අපහසු වී ඇතත් අනෙකුත් වැය ශීර්ෂ නිවැරදිව වැය දරා ඇත. ඉදිරියේ දී නිවැරදි හා සත්‍ය වශයෙන්ම පුරෝකතනය කරමින් ඇස්තමේන්තු සකස් කිරීමට කටයුතු කරමි.

	අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩල බඳවා ගෙන තිබුණි	පලාත් පාලන දෙපාර්තමේන්තුව සඳහා අනුමත කාර්ය මණ්ඩලය 23කි. දැනට සිටින කාර්ය මණ්ඩලය 42 කි. 2025 කාර්ය මණ්ඩල සමාලෝචනය අනුව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු වේ කාර්ය මණ්ඩලය 43 ක් අනුමැතිය සඳහා යොමුකර ඇත. දෙපාර්තමේන්තුව සඳහා අනුමත කාර්මික නිලධාරී විශේෂ ශ්‍රේණියේ තනතුරු 6 කි. එක් නිලධාරියෙකු සේවයේ යෙදී සිටින අතර ඉන් තනතුරු 2 ක් යටපත් කොට iii/ii/I ශ්‍රේණියේ තනතුරු 10 ක් අනුමත කර ගැනීම සඳහා මු.රෙ.71 අයදුම්පත් ඉදිරිපත් කර ඇත.
	සියළු නිලධාරීන් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි	වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර ඇත
	ආයතනයේ පවත්වා ගෙන යනු ලබන වෙබ් අඩවිය මඟින් මහජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා සටහන්කිරීම සඳහා අවස්ථාව සලසා දී නොතිබුණි	www.ldg.sg.gov.lk වෙබ් අඩවියේ වෙන් කර ඇත.
	සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබාදී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% ට වඩා අඩු මට්ටමක පැවැතුණ	නිවැරදි ඇස්තමේන්තු කිරීමට හා නියමිත පරිදි පැවැත්වීමට කටයුතු කරමි. 2025 වර්ෂය වන විට 95% වැඩි ප්‍රතිශතයක් අත්කර ගෙන ඇත.
	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය,යටත්ව මට්ටමේ/ ව්‍යාවන මට්ටමේ/ අහිතකර මට්ටමේ විය.	2023 වර්ෂයේ ගිණුම ගැන විගණනයේ යහපත් මතය ලබාගෙන ඇත.
242	**ආයතනයේ නම : නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(ඉංජිනේරුසේවා) කාර්යාලය**	
	මසක් තුළ අභ්‍යන්තර විගණන විමසුම් සඳහා පිළිතුරු නොසැපයූ අවස්ථා නිරීක්ෂණය විය.	විගණන විමසුම් විධායක ඉංජිනේරු කාර්යාල වෙත යොමු කර පිළිතුරු ගෙන්වා ගැනීමේදී පිළිතුරු ලැබීමේ ප්‍රමාදයන් සිදු වීම එයට ප්‍රධාන හේතුව වී ඇති බවත්, කළමනාකරණ විගණන කමිටු රැස්වීමේ දී විගණන විමසුම් සඳහා කඩිනමින් පිළිතුරු සැපයීමට කටයුතු කරන ලෙස විධායක ඉංජිනේරුවන්ට දැනුම් දී ඇත.

	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරංශ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(ඉංජිනේරු සේවා) කාර්යාලය සතුව පවතින වාහන 34 අතරින් වාහන 07ක් නිල වාහන වන අතර ඉතිරි වාහන සංචිත වාහන වේ. එම වාහන අතරින් වාහන 07ක ධාවන සටහන් එවිමේ ප්‍රමාදයක් සිදු වී ඇති අතර එය නිවැරදි කරමින් පවතින බැවින් ඉදිරි සති 02 ඇතුලත එම වාහන වලට අයත් ධාවන සටහන් ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලබන බව දන්වා සිටිමි.
	විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයිම මසකට වඩා වැඩි කාලයකට ප්‍රමාද කිරීම් නිරීක්ෂණය විය.	විගණන විමසුම් විධායක ඉංජිනේරු කාර්යාල වෙත යොමු කර පිළිතුරු ගෙන්වා ගැනීමේදී පිළිතුරු ලැබීමේ ප්‍රමාදයන් සිදු වීම එයට ප්‍රධාන හේතුව වී ඇති බවත් කළමනාකරණ විගණන කමිටු රැස්වීමේ දී විගණන විමසුම් සඳහා කඩිනමින් පිළිතුරු සැපයීමට කටයුතු කරන ලෙස විධායක ඉංජිනේරුවන්ට දැනුම් දී ඇත.
	සමාලෝචිත වර්ෂය තුළ විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් නියමිත පරිදි පවත්වා නොතිබීම.	2023 වර්ෂය තුල විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර 2ක් පමණක් පවත්වා ඇත.2024 වර්ෂයේ දී රැස්වීම් වාර 03ක්ද,2025 වර්ෂයේ නියමිත පරිදි කාර්තු 04 සඳහාම රැස්වීම් පවත්වා ඇත. 2026 වර්ෂය සඳහාද පළමු විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම පවත්වා ඇත.
	මු.රෙ.94(1) ප්‍රකාරව වැය විෂයයකට සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂය අවසානයට ඉතිරි වූ ප්‍රතිපාදන සීමාව ඉක්මවන පරිදි බැරකම්වලට එළඹ තිබුණි. ඇතැම් වැය විෂයන් සඳහා සලසා තිබූ මුළු ප්‍රතිපාදනයම ඉතිරි කර තිබූ අවස්ථා නිරීක්ෂණය විය.	2023 වර්ෂයේ හා ආසන්න වර්ෂවල ප්‍රතිපාදන සීමාව ඉක්මවා බැඳීම් ඇතිකර ගැනීමට සිදු වුවද එම වර්ෂ වල වෙන්වී ඇති ප්‍රතිපාදන සීමාව තුල පමණක් වියදම් දරා ඇත.2025 වර්ෂය වන විට එවැනි බැඳීම් වලට එළඹී නැත. 2025 වර්ෂය වන විට එක් වැය විෂයයක් හැරුණු කොට 100%ක ඉතිරිවීම් නොමැති බව ද දන්වමි.
	වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.	2025.12.31 දින වන විට විශ්‍රාම ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂයන් යටතේ වර්ෂයට වඩා වැඩි එක් නිලධාරියෙකුගේ ණය ශේෂයක් ඇත. M.V.පියසේන මහතාට අයත් රු.183,568ක මුදල විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව ඉදිරියේදී අයකර අප වෙත ලැබීමට සලස්වනු ඇත.

		<u>සේවය හැර ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂ.</u> 2025.12.31 දින වන විට සේවය හැරගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂ යටතේ, වර්ෂයකට වඩා වැඩි එක් නිලධාරියෙකුගේ ණය ශේෂයක් පවති.W.S.I.J.K. වර්ණකුලසූරිය ගෙන් අයවිය යුතු රු.24,307.69ක ණය ශේෂය මේ වන විට ඔහුගේ ඇපකරු වන R.A.U.N.රණසිංහ මහතාගේ වැටුපෙන් සෑම මසකම රු.1970/- වන වාරිකය හා පොළිය වශයෙන් අයකර ගැනීම සිදුවේ. 2025.12.31 දිනට ශේෂය- රු.24,307.69 2026.06.08 දිනට අයවීම් -<u>රු.11,820.00</u> මේ වන විට අයවීමට ඇති ශේෂය <u>රු.12487.69</u>
	අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩල බඳවාගෙන තිබුණි.	ඉහත කරුණු දෙක යටතේ හැර වෙනත් අයවීමට ඇති වර්ෂයකට වඩා වැඩි ණයගැති ශේෂ නොමැත. නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(ඉංජිනේරු සේවා) කාර්යාලයට අයත් අනුමත කාර්ය මණ්ඩලයට අනුව 2023 වර්ෂයේ අනුමත කාර්ය මණ්ඩල සීමාව ඉක්මවා සිටියේ සංවර්ධන නිලධාරීන් පමණි.අනුමත කාර්ය මණ්ඩලයට අනුව 2023.12.31 වන විට සංවර්ධන නිලධාරීන් 116 දෙනෙකු සිටි අතර මෙම කාර්යාලයට අනුමතව ඇත්තේ සංවර්ධන නිලධාරීන් 107 දෙනෙකු පමණි.සංවර්ධන නිලධාරීන් 09 දෙනෙකු අතිරික්තව සිට ඇත.මෙයට හේතු වී ඇත්තේ ප්‍රධාන ලේකම් කාර්යාලය විසින් විටින් විට වෙනස් වන රජයේ ප්‍රතිපත්ති මත බඳවා ගන්නා ලද සංවර්ධන නිලධාරීන් මෙම කාර්යාලයට අනුයුක්ත කිරීමයි. මේ වන විට මෙම කාර්යාලයේ සංවර්ධන නිලධාරීන් සිටින්නේ 103 දෙනෙකු පමණි.එබැවින් මේ වන විට සංවර්ධන නිලධාරීන් 04 දෙනෙකු පුරප්පාඩුව පවතී.මේ වන විට අනුමත සීමාව ඉක්මවා සංවර්ධන නිලධාරීන් නොමැත.
	සියලු නිලධාරීන් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි. වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත්	වත්කම් බැරකම් ප්‍රකාශ ලබා දීම සම්බන්ධව අදාළ මාණ්ඩලික නිලධාරීන් අමතා මගේ අංක CSE/202204 හා 2022.08.01 දිනැති ලිපිය හා 2023.12.18 දිනැති ලිපිය මගින් ප්‍රධාන ලේකම්ට ද පිටපතක් සහිතව දැනුවත් කර ඇත. මගේ අංක CSE/202204 හා 2024.01.31 දිනැති ලිපිය

	නොකළ අදාළ නිලධාරීන් පිළිබඳව ආයතන ප්‍රධානියා විසින් උචිත බලධරයා දැනුවත් කර නොතිබුණි.	මගින් මෙම කාර්යාලයේ වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කළ යුතු නිලධාරීන් සම්බන්ධව සංඛ්‍යාත්මක තොරතුරු ප්‍රධාන ලේකම් වෙත ඉදිරිපත් කරන ලදී. නැවත මගේ අංක CSE/20162-11 හා 2024.02.26 දිනැති ලිපිය මගින් වත්කම් බැරකම් ප්‍රකාශ ලබා නොදුන් නිලධාරීන් දැනුවත් කර ඇත.2024 වර්ෂයේ සිට අදාළ නිලධාරීන් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර ඇත.
	නිලධාරීන්ගෙන් රජයට හෝ පළාත් සභාවට සිදු වූ පාඩු පූර්ණය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.	අංක PE5699 කැබ් රථයේ අනතුර සම්බන්ධයෙන් එහි රියදුරු M.A.D.K.P.K.සමරදිවාකර මහතාගේ වැටුපෙන් රු.436,749.46ක මුළු අලාභ මුදල වාරික වශයෙන් අයකරනු ලබන අතර මේවන විට රු.94,664.26ක ශේෂයක් ඇති අතර ඉදිරියට රු.3,797.21 බැගින් දැනට ඔහු සේවය කරන පළාත් ආදායම් දෙපාර්තමේන්තුව විසින් අයකරනු ලැබේ.
	සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම්ගතව නොතිබුණි.	සමස්ථ කාර්ය මණ්ඩලයට අදාළව වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් ඒ වන විට සකස් කර නොතිබුණි.නමුත් 2023.11.30 දිනැතිව නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2018(1) හි 03 ඡේදය මගින් වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කිරීම තව දුරටත් අවශ්‍ය නොවන බව දන්වා ඇත.
	පළාත් ගිණුම් පිළිබඳ කාරක සභාවේ නිර්දේශ/නියෝග ක්‍රියාත්මක කර නොතිබුණි.	• 2023 වර්ෂයට අදාළ කාර්යාලය සතු ඉඩම් කැබලි 24ක ඉදිකළ නිල නිවාස 40න් 20ක අයිතිය පවරා ගෙන නොතිබීම යන කාරණය සම්බන්ධයෙන් මේ වන විට නිර්දේශ ක්‍රියාත්මක කර කටයුතු සිදු කරමින් පවතී. මේ වන විට ඉඩම් 24 න් ඉඩම් 07 පැවරුම් සහතික මඟින් මෙම කාර්යාලය වෙත පවරා දී ඇත. අනෙකුත් ඉඩම් නියමානුකූල කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත බලය පවරා ඇත. • 2023 වසරේදී තාර හා කෝලාස් ප්‍රමාණවත් තොග තිබිය දී නැවත මිලදී ගැනීම හේතුවෙන් ගබඩාවල අතිරික්ත තොග ලෙස ගබඩාවල රඳවා තිබීම යන කරුණ සම්බන්ධයෙන් ද නිර්දේශ ක්‍රියාත්මක කර ඇති අතර 2025.12.26 දින වන විට ගබඩා තුල තාර ශේෂයක් නොතිබිණි

242	ආයතනයේ නම : සභා ලේකම් කාර්යාලය	
	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා පිළිබඳව වන නිර්දේශ ද අනෙකුත් නිර්දේශ ද නියමිත කාල වකවානුව තුළ ක්‍රියාත්මක කර නොතිබුණි ආයතනය තම විෂය පථය අනුව තිරසර අරමුණු හඳුනාගෙන නොතිබිණි. හඳුනාගත් තිරසර අරමුණු ඉටු කර ගැනීම සඳහා ළඟා කර ගත යුතු ඉලක්ක තීරණය කර කර නොතිබුණි. හඳුනාගත් තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය මැන බැලීම සඳහා දර්ශක නියම කර නොතිබුණි	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්තතා, ඌනතා පිළිබඳ නිර්දේශයන් මේ වනවිට ක්‍රියාත්මක කර ඇත. 2024, 2025 වර්ෂවල නියමිත පරිදි භාණ්ඩ සමීක්ෂණ සිදු කර එහි නිර්දේශයන් ද නියමිත කාළ වකවානුව තුළ ක්‍රියාත්මක කර ඇත. 1987 අංක:42 දරණ පළාත් සභා පනතේ අංක:17(1) අනුව සභා ලේකම් කාර්යාලය ස්ථාපිත කර ඇත. ඒ අනුව පළාත තුළ ව්‍යවස්ථාදායකය වශයෙන් තිරසර සංවර්ධන අරමුණු ගලපා ගැනීමේදී අංක: 16, 16.7, 16.b යන කරුණු ආයතනයට අදාළ කරගත් අතර, ඒ සඳහා දර්ශක වශයෙන් සභා වාර පැවත්වීම හා කාරක සභා පැවැත්වීමේ වාර ගණන හඳුනාගෙන ඇත. එහෙත් ආයතනයට පාලනය කළ නොහැකි හේතුවක් වන පළාත් සභා මැතිවරණය 2017.09.27 දින සිට මේ දක්වා නොපැවැත්වීම හේතුවෙන් ව්‍යස්ථාදායකයේ කාර්යභාරය ක්‍රියාත්මක නොවන තත්ත්වයකට පත්ව ඇත.මෙම කාර්යාලය විසින් ඊට පරිබාහිරව සංවර්ධන හෝ වෙනයම් විෂයක් ක්‍රියාත්මක වීමක් සිදු නොවන බැවින් මැතිවරණයක් පවත්වා සභාව ස්ථාපිත වන තුරු දර්ශක ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් හැකියාවක් හෝ කිසිදු බලතලයක් අප සතුව නොමැත. එසේ වුවද වර්තමානයේ **තිරසර සංවර්ධන අරමුණු 16 හි 16.5 අනුව** ආයතනය තුළ අල්ලස හා දූෂණය අවම කිරීම සඳහා ආයතනය තුළ අභ්‍යන්තර කටයුතු ඒකකයක් පිහිටුවීම මඟින් මහජනතාව වෙත ආයතනයෙන් සේවා ලබාදීම සම්බන්ධයෙන් යෝජනා, පැමිණිලි ඉදිරිපත් කිරීමේ අවස්ථාව ලබාදීම, ආයතනය වෙත සුපිළිපන් නිලධාරියෙකු පත්කර ඇත. **තිරසර සංවර්ධන අරමුණු 16.10 අනුව** තොරතුරු පනත ප්‍රකාරව මහජනතාව වෙතින් ලැබෙන තොරතුරු ඉල්ලීම්වලට අදාළව තොරතුරු සැපයීමට කටයුතු කර ඇත.

243	**ආයතනයේ නම :** පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව	
	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි.	• 2024 වර්ෂයේ සිට වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙළ කර ඇත.
	අක්මුදල් ඉල්ලුම් පත්‍රය නියමිත දිනට නියමිත පරිදි ඉදිරිපත් කර නොතිබුණි.	• 2024 වර්ෂයේ සිට අක්මුදල් ඉල්ලුම් පත්‍රය නියමිත දිනට නියමිත පරිදි ඉදිරිපත් කර ඇත.
	මසක් තුළ අභ්‍යන්තර විගණන විමසුම් සඳහා පිළිතුරු නොසැපයූ අවස්ථා නිරීක්ෂණය විය.	• අභ්‍යන්තර විගණන විමසුම් සඳහා පිළිතුරු ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාල හරහා රෝහල් හා සෞඛ්‍ය ආයතන වෙතින් ගෙන්වා ගත යුතු බැවින් ඒ සඳහා යම්කිසි කාලයක් ගත වන බැවින් මසක් ඇතුළත පිළිතුරු සැපයීමට යම් ප්‍රමාදයක් ඇති වුවද හැකි අවම කාලයක් තුළ පිළිතුරු සැපයීමට කටයුතු කර ඇත.
	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත ඌනතා පිළිබඳව වන නිර්දේශ ද අනෙකුත් නිර්දේශ ද නියමිත කාලවකවානු තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.	• භාණ්ඩ සමීක්ෂණ මගින් අනාවරණය වූ ඌනතා පිළිබඳව අභියාචනා පරීක්ෂණ කටයුතු සිදුකරමින් පවතින අතර ඇතැම් රෝහල්වල (ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය-කෑගල්ල/ප්‍රාදේශීය වෛද්‍ය සැපයුම් අංශය-කෑගල්ල/මුලික රෝහල-වරකාපොල/මුලික රෝහල-කරවනැල්ල/ප්‍රාදේශීය රෝහල-උදුගොඩ) පරීක්ෂණ සියල්ල අවසන් කර ඇත. අනෙකුත් ආයතනවලද ඉදිරියේදී අවසන් කිරීමට කටයුතු කරමි.
	පළාත් මුල්‍ය රීති ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිම වී දින 14ක් ඇතුළත නිරවුල් කර නොතිබුණි.	• මේ වන විට අදාළ කාර්යය නිම වූ වහාම අතුරු අග්‍රිම පියවීම සිදු කරන බව කාරුණිකව දන්වමි.
	වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිග ණය ශේෂ පැවතුණි.	
	අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩල බඳවාගෙන තිබුණි.	• පැවති ණය ශේෂ වලින් බොහොමයක් මේ වන විට නිරවුල් කර ඇත. ඉතිරි ණය ශේෂ ද නිරවුල් කිරීමට කටයුතු කරමින් පවතී.

		කාර්ය මණ්ඩල අනුමත නොමැති ප්‍රාථමික වෛද්‍ය ප්‍රතිකාර ඒකකවල වෛද්‍ය නිලධාරීන් සේවය කරන අතර ඔවුන් අනුයුක්ත කරනුයේ කොළඹ රේඛීය අමාත්‍යාංශයෙනි. සෞඛ්‍ය කාර්ය සහයක(කණිෂ්ඨ) සේවකයින් අතිරික්ත වී ඇත්තේ අභ්‍යන්තර උසස්වීම් වලින් සම්පූර්ණ කිරීමට යටත්ව ප්‍රධාන අමාත්‍යාංශ ලේකම් විසින් බඳවාගෙන ඇත. • මෙම කාර්යාලයේ සේවයේ නියුතු සියලුම මාණ්ඩලික නිලධාරීන් අදාල කාල සීමාව තුලදී වත්කම් බැරකම් ප්‍රකාශ ලබා දීම සිදු කරනු ලබයි.
	සියලු නිලධාරීන් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි. වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් නොකළ අදාළ නිලධාරීන් පිළිබඳව ආයතන ප්‍රධානියා විසින් උචිත බලධරයා දැනුවත් කර නොතිබුණි.	• ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලවල බොහොමයක් නිලධාරීන් වත්කම් බැරකම් ප්‍රකාශ නියමිත කාලපරිච්ඡේදය තුළ ඉදිරිපත් කර ඇති අතර ඉතිරි නිලධාරීන්ට දැනුවත් කිරීමේ ලිපි නිකුත් කර ඇත.
	නිලධාරීන්ගෙන් රජයට හෝ පළාත් සභාවට සිදු වූ පාඩු පුර්ණය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.	
	2018.01.24 දිනැති අංක 05/2018(1) දරණ චක්‍රලේඛයෙන් සංශෝධිත 2008.02.06 දිනැති අංක 05/2008 දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ චක්‍රලේඛය ප්‍රකාරව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය නිසි පරිදි පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි. ආයතනයේ පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය කිරීමට සහ ඇඟයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කර	• පුරවැසි සේවා ප්‍රඥප්තිය සකස් කර සියලු දෙනාටම දැක ගත හැකි පරිදි ප්‍රදර්ශනය කර ඇත. සේවා සැපයීම සම්බන්ධයෙන් පැමිණිලි කිරීමට හෝ ගැටළු ඉදිරිපත් කිරීම සඳහා මාණ්ඩලික නිලධාරීන් නම් කර ඇත.

	නොතිබුණි. සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවතුණි. ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය යටත්ව මට්ටමේ/ව්‍යාවන මට්ටමේ/අහිතකර මට්ටමේ විය.	• මේ වන විට වාර්ෂිකව සැලසුම්ගත පුහුණු අවස්ථා සියල්ලම සිදු කරන බව දන්වමි. 2025 වර්ෂය සඳහා තත්වාගණනය කළ මතයක් ලැබී ඇත.
243	**ආයතනයේ නම : පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය**	
	හානි පිළිබඳ ලේඛනය නිසි පරිදි යාවත්කාලීනව පවත්වා නොතිබීම. අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුල පිළිතුරු නොසපයා තිබීම. පළාත් මූල්‍ය රීති ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබීම. වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්තතා , ඌනතා පිළිබඳව වන නිර්දේශ ද අනෙකුත් නිර්දේශ ද නියමිත කාල වකවානු තුල ක්‍රියාත්මක කර නොතිබීම. පළාත් මූල්‍ය රීති ප්‍රකාරව නිකුත් කළ	හානි පිළිබඳ ලේඛණය යාවත්කාලීන කර ඇති අතර මේ වන විට නිසි පරිදි පවත්වාගෙන යනු ලැබේ. විගණන විමසුම් සඳහා දින 14 ක් ඇතුළත පිළිතුරු සැපයීමට කටයුතු කර ඇත. නිවැරදි කිරීමට සටහන් කරගෙන ඇත. එසේ නිරවුල් කිරීමට උපදෙස් ලබා දී ඇත.

	තත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිම වී දින 14 ක් ඇතුලත නිරවුල් කර නොතිබීම.	
	විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම මසකට වඩා වැඩි කාලයකට ප්‍රමාද වීම.	දින 14 ක් තුල පිළිතුරු සැපයීමට කටයුතු කර ඇත.
	සමාලෝචිත වර්ෂය තුල විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් නියමිත පරිදි පවත්වා නොතිබීම.	මේ වන විට අදාල කාර්තුව තුල විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම සිදු කරයි.
	වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතීම.	වර්ෂයකට වඩා වැඩි හිඟ ණය ශේෂ සියල්ල අය කර ගෙන ඇත.
	සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුලත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම්ගතව නොතිබීම.	රා.ප.ව .02/2018 (1)හි 03 ඡේදය මඟින් වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කිරීම තව දුරටත් අවශ්‍ය නොවන බව රාජ්‍ය පරිපාලන,ස්වදේශ කටයුතු,පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් දන්වා ඇත. එබැවින් 2023 වසරේ කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම්ගතවීම සිදු නොකරන ලදි.
	සැලසුම්ගත පුහුණු අවස්ථා වලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% ට වඩා අඩු මට්ටමක පැවතුණි.	2023වර්ෂයට අදාලව සැලසුම් කරන ලද ඉතිරි පුහුණු අවස්ථා නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) කාර්යාලය විසින් කළමනාකරණ සංවර්ධන පුහුණු ඒකකයේ පවත්වනු ලබන පුහුණු වැඩසටහන් සඳහා නිලධාරීන් යොමු කිරීම මඟින් ඉටු කරගෙන ඇත. එම පුහුණු වැඩසටහන් සඳහා නිලධාරීන්, 2023 වර්ෂයේ 36ක් , 2024 වර්ෂයේ 30ක් හා 2025 වර්ෂයේ 38 දෙනෙකු වශයෙන් සහභාගී වී ඇත.
	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය,යටත්ව මට්ටමේ/ව්‍යාවන මට්ටමේ/ අහිතකර මට්ටමේ විය.	තත්වාගණනය කල මතයක් ලබා දී ඇති අතර ඊට පදනම් වූ ගිණුම්කරණ අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කර ඇත.

244	ආයතනයේ නම : ප්‍රධාන අමාත්‍යාංශය	
	මසක් තුළ අභ්‍යන්තර විගණන විමසුම් සඳහා පිළිතුරු නොසැපයූ අවස්ථා නිරීක්ෂණය විය පළාත් මූල්‍ය රීති ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිම වී දින 14 ක් ඇතුළත නිරවුල් කර නොතිබුණි. විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම මසකට වඩා වැඩි කාලයකට ප්‍රමාද කිරීම් නිරීක්ෂණය විය ඇතැම් වැය විෂයන් සඳහා සලසා තිබූ මුළු ප්‍රතිපාදනයම ඉතිරි කර තිබූ අවස්ථා නිරීක්ෂණය විය අත්තිකාරම් කාර්ය සඳහා පළාත් සභාව විසින් පවා තිබුණු 06සීමාවන් පිළිපැද නොතිබුණි.	අමාත්‍යාංශය යටතේ පවතින වෙනත් දෙපාර්තමේන්තු හා ආයතන වෙතින් පිළිතුරු ගෙන්වා ගත යුතු බැවින් හා ඇතැම් අවස්ථාවල ක්ෂේත්‍ර පරීක්ෂණ සිදු කිරීමට සිදුවීම වැනි හේතු මත මෙබඳු ප්‍රමාදයන් සිදු වී ඇත. ඉදිරියේදී අදාළ ආයතනයන්ගෙන් පිළිතුරු ලැබෙන තෙක් සකස් කළ හැකි පිළිතුරු අතුරු පිළිතුරක් ලෙස ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. වැඩසටහන් සඳහා නිකුත් කරන අතුරු අග්‍රිම පියවීම දින 14ක් ඇතුළත සිදු කිරීමට කටයුතු කරන ලෙසට අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දෙන ලදී. අමාත්‍යාංශය යටතේ පවතින වෙනත් දෙපාර්තමේන්තු හා ආයතන වෙතින් පිළිතුරු ගෙන්වා ගත යුතු බැවින් හා ඇතැම් අවස්ථාවල ක්ෂේත්‍ර පරීක්ෂණ සිදු කිරීමට සිදුවීම වැනි හේතු මත මෙබඳු ප්‍රමාදයන් සිදු වී ඇත. ඉදිරියේදී අදාළ ආයතනයන්ගෙන් පිළිතුරු ලැබෙන තෙක් සකස් කළ හැකි පිළිතුරු අතුරු පිළිතුරක් ලෙස ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. සබරගමුව පළාත් සභාව විසුරුවා හැර තිබීම නිසා මහ ඇමති කාර්යාලය වෙනුවෙන් වෙන් කර ඇති මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී ඇත. ඇතැම් වැය විෂයයන් සඳහා ඇස්තමේන්තු කළද ඇතැම් අවස්ථාවල වියදම් සඳහා වවුචර් ඉදිරිපත් නොවීම මත මෙසේ ප්‍රතිපාදන ඉතිරි වූ අවස්ථා ඇත. සීමාවන් පිලිපැදීමට කටයුතු කරමි වර්තමානය වන විට හිඟ ණය නොමැති බව සඳහන් කරමි.

	වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි. 2018.01.24 දිනැති අංක 05/2018 (1) දරන චක්‍රලේඛයෙන් සංශෝධිත 2008.02.06 දිනැති අංක 05/2008 දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ චක්‍රලේඛය ප්‍රකාරව පුරවැසි/සේවා ලාභී ප්‍රඥප්තිය නිසි පරිදි පිළියෙළ කර ක්‍රියාත්මක කර නොතිබුණි. ආයතනයේ පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිලිබඳ අධීක්ෂණය කිරීමට සහ ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස්කර නොතිබුණි.	මේ වන විට ප්‍රඥප්තිය සකස් කර නිසි පරිදි ක්‍රියාත්මක කරනු ලබයි. එකී පුරවැසි ප්‍රඥප්තිය අනුව කටයුතු සිදු වීම සම්බන්ධව අංශ අනුව අධීක්ෂණ කටයුතු සිදු කරනු ලබන අතර ඊට අමතරව ලැබෙන පැමිණිලි ආදිය මගින් අනාවරණය වන කරුණු අනුව ද පුරවැසි ප්‍රඥප්තියට අනුකූලව කටයුතු ක්‍රියාත්මක වන්නේද යන්න පිළිබඳව අධීක්ෂණය කරනු ලබයි. ඒ අනුව මේ වන විට උක්ත කාරණය සම්බන්ධ සියලු නිවැරදි කිරීම් සිදු කරනු ලැබ ඇත.
244	**ආයතනයේ නම : සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව**	
	විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම මසකට වඩා වැඩි කාලයකට ප්‍රමාද වීම. සමාලෝචිත වර්ෂය තුළ විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් නියමිත පරිදි පවත්වා නොතිබීම. අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩලය බඳවා ගැනීම	මේ සම්බන්ධයෙන් වැඩි අවධානයක් යොමු කළ අතර ඉන් පසු ලැබුණු විගණන විමසුම් සඳහා කඩිනමින් පිළිතුරු සකස් කර යොමු කිරීම සඳහා කටයුතු කරන ලදි. 2023.07.10, 2023.10.20 හා 2023.12.27 දින වල රැස්වීම් වාර 03ක් පවත්වා ඇති අතර ඉන් පසු වර්ෂ වලදී කාර්තුවක් සඳහා රැස්වීම් වාරයක් පැවැත්වීමට කටයුතු කරන ලදි මෙම දෙපාර්තමේන්තුව මඟින් කාර්යමණ්ඩල බඳවා ගැනීම් කටයුතු නොකරන අතර අතිරික්ත කාර්ය මණ්ඩලයක් මේ දක්වා පවතී.

245	ආයතනයේ නම : පළාත් ඉඩම් කොමසාරිස් කාර්යාලය	
	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි.	2024 හා 2025 වර්ෂ සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුමත කර නියමිත දිනට ඉදිරිපත් කර ඇත.
	මසක් තුළ අභ්‍යන්ත විගණන විමසුම් සඳහා පිලිතුරු නොසැපයූ අවස්ථා නිරීක්ෂණය විය.	මෙම දෙපාර්තමේන්තුව වෙත සෘජුව යොමු කරන ලද විගණන විමසුම් සඳහා දින 14 ක් ඇතුළත පිලිතුරු යොමු කරන අතර, ප්‍රාදේශිය ලේකම් කාර්යාල වෙත යොමු කරන ලද විගණන විමසුම් සඳහා පිළිතුරු එම කාර්යාල වලින් ලබාගෙන අඩුපාඩු සම්පූර්ණ කර නැවත යොමු කිරීමේදී ඇතැම් විට මසකට වැඩි කාලයක් ගත වේ.
	සමාලෝචිත වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණ පවත්වා ඒවායේ වාර්තා මූල්‍ය රීති ප්‍රකාරව විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	2024 හා 2025 වර්ෂ සඳහා භාණ්ඩ සමීක්ෂණ සිදු කර ඒවායේ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත.
	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	2024 හා 2025 වර්ෂ සඳහා සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත.
	පළාත් මූල්‍ය රීති ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිම වි දින 14 ක් ඇතුළත නිරවුල් කර නොතිබුණි.	2024 හා 2025 වර්ෂ වල තත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිම වි දින 14 ක් ඇතුළත නිරවුල් කිරීමට කටයුතු කර ඇත.
	සමාලෝචිත වර්ෂය තුළ විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් නියමිත පරිදි පවත්වා නොතිබුණි.	2024 හා 2025 වර්ෂ සඳහා විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් හතර බැගින් (කාර්තුවට එක බැගින්) පවත්වන ලදී.
	ඇතැම් වැය විෂයන් සඳහා සලසා තිබූ මුළු ප්‍රතිපාදනයම ඉතිරි කර තිබූ අවස්ථා නිරීක්ෂණය විය.	යම් ඉල්ලීමක් ඉදිරිපත් වුවහොත් ගෙවීම් කිරීම සඳහා ඇතැම් වැය විෂයන් සඳහා ප්‍රතිපාදන ලැබී තිබිය යුතුය. (උදා:-ඉන්ධන දීමනාව) ඉල්ලුම් නොකළහොත් ප්‍රතිපාදන ඉතිරි වේ. හැකිතාක් දුරට මෙම තත්වය අවම කර ගැනීමට කටයුතු කරමි.

245	ආයතනයේ නම : ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව	
	මසක් තුළ අභ්‍යන්තර විගණන විමසුම් සඳහා පිළිතුරු නොසැපයූ අවස්ථා නිරීක්ෂණය විය. විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම මසකට වඩා වැඩි කාලයක් ප්‍රමාද කිරීම් නිරීක්ෂණය විය.	2024 වර්ෂයේ අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් ඇතුළත පිළිතුරු සපයා ඇත.
	සමාලෝචිත වර්ෂය තුළ විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් නියමිත පරිදි පවත්වා නොතිබුණි.	2024 හා 2025 වර්ෂ සඳහා විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් හතර බැගින් (කාර්තුවට එක බැගින්) පවත්වන ලදී.
	ඇතැම් වැය විෂයන් සඳහා සලසා තිබූ මුළු ප්‍රතිපාදනයම ඉතිරි කර තිබූ අවස්ථා නිරීක්ෂණය විය.	2024 වර්ෂයේදී මුළු ප්‍රතිපාදනයම ඉතිරි වූ වැය ශීර්ෂ නොමැත.
	ආයතනය පිළිබඳව මහජනයාට අවශ්‍ය තොරතුරු ලබා දීම සඳහා වෙබ් අඩවියක් නිරිමාණය කර පවත්වා ගෙන ගොස් නොතිබුණි. ආයතනයේ පවත්වා ගෙන යනු ලබන වෙබ් අඩවිය මගින් මහජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දී නොතිබුණි.	වෙබ් අඩවියක් නිර්මාණය කරමින් පවතින අතර, දැනට ප්‍රධාන ලේකම් කාර්යාලයේ අනුමැතියෙන් යුතුව facebook පිටුවක් පවත්වාගෙන යනු ලබන අතර, වැදගත් තොරතුරු ඒ හරහා සමාජගත කරනු ලබයි.
	2018.01.24 දිනැති අංක 05/2018 (1) දරන චක්‍රලේඛයෙන් සංශෝධිත 2008.02.06 දිනැති අංක 05/2008 දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ චක්‍රලේඛය ප්‍රකාරව පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය නිසි පරිදි	මේ වන විට සේවාලාභී ප්‍රඥප්තිය සිංහල භාෂාවෙන් සකස් කර අවසන් අතර අනෙකුත් භාෂාවන්ට පරිවර්තනය සඳහා කටයුතු කරමින් පවතී.

	පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි. ආයතනයේ ගිණුම පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ/ ව්‍යාවන මට්ටමේ/ අහිතකර මට්ටමේ විය.	 2024 හා 2025 යන වර්ෂවල විගණන මතය යටත්ව මට්ටමින් ලැබී ඇත. ඉදිරියේදී සත්‍ය හා සාධාරණ මතයක් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමි.
246	**ආයතනයේ නම : පළාත් කර්මාන්ත අමාත්‍යාංශය**	
	පාරිභෝජ්‍ය ද්‍රව්‍ය ලේඛනය නිසි පරිදි යාවත්කාලීනව පවත්වා නොතිබුණි. හානි පිළිබඳ ලේඛනය නිසි පරිදි යාවත්කාලීනව පවත්වා නොතිබුණි. මුල්‍ය බලතල පැවරීම ආයතනය තුළ සන්නිවේදනය කර නොතිබුණි. 2004.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ ප්‍රකාරව රජයේ වැටුප් සකස් කිරීමේ පරිගනක මෘදුකාංගයට අදාළ මුරපද තුන් මසකට වරක් වෙනස් කර නොතිබුණි. වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙළ කර නොතිබුණි.	මේ වන විට පාරිභෝජ්‍ය ද්‍රව්‍ය ලේඛනය නිසි පරිදි යාවත්කාලීන කර පවත්වා ගෙන යයි. මේ වන විට හානි පිළිබඳ ලේඛනය නිසි පරිදි යාවත්කාලීන කර පවත්වා ගෙන යයි. 2024 වර්ෂයේ සිට මුල්‍ය බලතල පැවරීම ආයතනය තුළ සන්නිවේදනය කර ඇත. වැටුප් සකස් කිරීමේ පරිගණක මෘදුකාංගයට අදාළ මුරපදය මෙම වර්ෂයේ සිට තුන් මසකට වරක් වෙනස් කිරීමට කටයුතු කර ඇත. ඉදිරියටද ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දී ඇත. 2024 වර්ෂය සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම සිදු කර ඇත. ඉදිරියට ද ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දී ඇත

	මසක් තුළ අභ්‍යන්තර විගණන විමසුම් සඳහා පිළිතුරු නොසැපයූ අවස්ථා නිරීක්ෂණය විය.	මේ වන විට නිසි පරිදි යාවත්කාලීන කර පවත්වා ගෙන යයි.
	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	2023 න් පසු සියලුම වාහන සම්බන්ධයෙන් දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා නියමිත පරිදි විගණකාධිපති වෙත ඉදිරිපත් කරනු ලැබේ.
	සෑම වාහනයක් සඳහාම ලොග් පොත් යාවත්කාලීන පදනමක් මත පවත්වා ගෙන නොතිබුණි.	2023 වර්ෂයේ ඇගයීම් සිදු කරන අවස්ථාවේ ලොග් සටහන් පොත් යාවත්කාලීනව නොපැවතුණද මේ වන විට ලොග් පොත් යාවත්කාලීනව පවත්වා ගෙන යනු ලැබේ.
	සමාලෝචිත වර්ෂය තුළ විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් නියමිත පරිදි පවත්වා නොතිබුණි.	2024 වර්ෂයේ සිට විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් නියමිත පරිදි පවත්වා ගෙන යනු ලබයි.
	වර්ෂයකට වඩා වැඩි කාලයක සිය පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි	ණය ගැතියන්ගේ ණය ශේෂයන් මේ වන විට නිරවුල් කිරීම කර ඇත.සේවය අතහැර ගොස් සිටින නිලධාරින්ගෙන් අය වීමට තිබූ රු.4600.00 ක ණය ශේෂය 2024.09.26 දින අය කරගන්නා ලදී.
	සියලු නිළධාරීන් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි	2024 වර්ෂය සඳහා සියලු නිළධාරීන්ගේ වත්කම් බැරකම් ප්‍රකාශ සකස් කර ලබා දී ඇත. ඉදිරියට ද ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දී ඇත .
	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ / ව්‍යාවන මට්ටමේ / අහිතකර මට්ටමේ විය.	2023 ,2024 වර්ෂ සඳහා තත්වාගණනය කළ මතයක් ලැබී ඇත.

246	ආයතනයේ නම : නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය කළමනාකරණ) කාර්යාලය	
	විගණන විමසුම් ලේඛනය නිසි පරිදි යාවත්කාලීනව පවත්වා නැත	විගණන විමසුම් ලේඛනය නිසි පරිදි යාවත්කාලීනව පවත්වා ගෙන යාමට අවශ්‍ය කටයුතු යොදා ඇත.
	නිවාඩු ලේඛනය නිසි පරිදි යාවත්කාලීනව පවත්වා නොතිබුණි	2024 වර්ෂයේ සිට යාවත්කාලීනව පවත්වා ගෙනයාමට නටයුතු යොදා ඇත
	මසක් තළ අභ්‍යන්තර විගණන විමසුම් සඳහා පිළිතුරු නොසැපයූ අවස්ථා නිරීක්ෂණය විය	ඉදිරියට නියමිත කාලය තුළ පිළිතුරු සැපයීමට අවශ්‍ය කටයුතු යොදා ඇත.
	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා සාරාංශ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි	සංචිත වාහන සඳහා පසුගිය දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ සියල්ලම මේ වන විට ජාතික විගණන කාර්යාලය වෙත ඉදිරිපත් කර ඇත. ඉදිරියේදී නියමිත පරිදි ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කරමි.
	සෑම වාහනයක් සඳහාම ලොග් පොත් යාවත්කාලීන පදනමක් මත පවත්වා නොතිබුණි	මෙම කාර්යාලය සතුව වාහන 03ක් පවතින අතර එම වාහන වලට අදාලව ලොග් පොත් නියමිත පරිදි යාවත්කාලීන කිරීමට කටයුතු කර ඇත.
	අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩලය බඳවා ගෙන තිබුණි	පළාත් සභා අනුමත කාර්ය මණ්ඩලය තුළ බඳවා ගත් නිලධාරීන් සේවා අවශ්‍යතාව මත මෙම ආයතනයට අනුයුක්ත කර ඇත
247	ආයතනයේ නම : පරිවාස දෙපාර්තමේන්තුව	
	රාජ්‍ය චක්‍රලේඛ 2004/171 ප්‍රකාරව වැටුප් සකස් කිරීමේ පරිගණක මෘදුකාංගයට අදාළ මුර පදය තුන් මසකට වරක් වෙනස් කර	2025 වර්ෂයේ සිට වැටුප් සකස් කිරීමේ මෘදුකාංගයට අදාළ මුරපදය ත්‍රෛමාසිකව වෙනස් කිරීමට කටයුතු කර ඇත.

	නොතිබුණි.	
	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි	2023ක්‍රියාකාරී සැලැස්ම සකස් කර තිබූ අතර, එහි පිටපතක් මේ සමඟ යොමු කරමි.
	අක්මුදල් ඉල්ලුම් පත්‍රය නියමිත දිනට නියමිත පරිදි ඉදිරිපත් කර නොතිබුණි	අක් මුදල් අවශ්‍යතාවය මත නියමිත කාලයට ඉල්ලීම් ඉදිරිපත් කරනු ලැබේ.
	සමාලෝචිත වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණ පවත්වා ඒවායේ වාර්තා පළාත් මූල්‍ය රීති ප්‍රකාරව විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්තතා, ඌනතා පිළිබඳව වන නිර්දේශ ද අනෙකුත් නිර්දේශ ද නියමිත කාලවකවානුව තුළ ක්‍රියාත්මක නොකිරීම.	2024 වර්ෂයේ සිට නියමිත දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තා ඉදිරිපත් කර ඇති අතර භාණ්ඩ සමීක්ෂණ මගින් අනාවරණය වූ නිර්දේශ නියමිත කාලය තුළ ක්‍රියාත්මක කර ඇත.
	පළාත් මූල්‍ය රීති ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිම වී දින 1ක් ඇතුළත නිරවුල් කර නොතිබුණි.	අප දෙපාර්තමේන්තුවට අයත් සියළුම රථ වාහනවලට අයත් ලොග් සටහන් පොත් යාවත්කාලීන කර පවත්වාගෙන යයි.
	අනුමත අග්‍රිම ගිණුම් ශේෂ පළාත් භාණ්ඩාගාරයේ පොත් සමඟ කාර්තුමය වශයෙන් සසඳනු ලබන අක්මුදල් සැසඳුම් ප්‍රකාශය නියමිත දිනට පෙර පළාත් භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කර නොතිබුණි	පළාත් භාණ්ඩාගාර ප්‍රකාශ අනුව අක්මුදල් සැසඳුම් ප්‍රකාශය නියමිත දිනට සැසඳීම් කිරීම සිදු කරනු ලබයි.

	සමාලෝචිත වර්ෂය තුළ විගණනය හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් නියමිත පරිදි පවත්වා නොතිබුණි.	2024 වර්ෂයේ සිට කාර්තුමය වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වාගෙන යනු ලබයි.
	නියමිත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩල බඳවාගෙන තිබුණි.	පරිවාස ළමාරක්ෂක හා සමාජසේවා දෙපාර්තමේන්තුවේ අනුමත සංවර්ධන නිලධාරී කාර්ය මණ්ඩලය අතර වන 50, රජයේ ප්‍රතිපත්තියක් අනුව උපාධිධාරීන් රාජ්‍ය සේවයට බඳවා ගැනීමේදී අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා සංවර්ධන නිලධාරීන් දෙනෙ 28කු පරිවාස දෙපාර්තමේන්තුව යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල සමාජ සේවා සංවර්ධන නිලධාරීන් ලෙස පත්කර තිබුනිවර්තමානයේ ස්ථාන මාරු හා . වීම් වැනි හේතූන් නිසා මෙම අතිරික්ත සංවර්ධන නිලධාරීන්විදේශගත වර්තමානයේ රටේ පවත්නා තත්ත්වය මත සහ .දක්වා අඩුවී ඇත 23 ජනගහණයේ වැඩිවීමත් සමඟ කළයුතු රාජකාරී ප්‍රමාණය දිනෙන් දින ඉහළ යමින් තිබෙන අතර සිටින නිලධාරීන් මගින් මෙම සේවා කිරීම ඉතා අපහසු තත්ත්වයක පවතින බැවින් එම අතිරික්ත සංවර්ධන නිලධාරී තනතුරු අනුමත කර අනුමත සංවර්ධන නිලධාරී කාර්ය මණ්ඩලය ඉහළ නංවා දෙන ලෙස පළාත් සභා කාර්ය මණ්ඩල සමාලෝචනයේදී ඉල්ලීම් කර ඇත.
	ආයතනය පිළිබඳව මහජනයාට අවශ්‍ය තොරතුරු ලබා දීම සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කර පවත්වාගෙන ගොස් නොතිබුණි	අප දෙපාර්තමේන්තුවට අදාළ වූ වෙනම වෙබ් අඩවියක් පවත්වාගෙන යනු නොලබන අතර, සබරගමු පළාත් සභා වෙබ් අඩඩවිය වෙත අප දෙපාර්තමේන්තුව සම්බන්ධයෙන් යොමු කරනු ලබන තොරතුරු ප්‍රසිද්ධ කරනු ලබයි.
	සැලසුම්ගත පුහුණු අවස්ථාවන්වලදී ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% ට වඩා අඩු මට්ටක පැවතුණි.	වාර්ෂිකව සැලසුම් කළ පුහුණු අවස්ථා නිසි පරිදි සම්පූර්ණ කරන ලෙස උපදෙස් ලබා දි ඇති අතර ඒ අනුව පුහුණු අවශ්‍යතා නිසි පරිදි සිදු කරනු ලබයි.

248	ආයතනයේ නම : කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව	
	අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩල බඳවාගෙන තිබුණි.	මෙම දෙපාර්තමේන්තුවේ සංවර්ධන නිලධාරි තනතුරු 05 ක් මේ වන විට අතිරික්තව පවති. 2022 වර්ෂයේ උපාධිධාරීන් රැකියාගත කිරීමේ වැඩසටහන අනුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ලබාදුන් පත්වීම් අනුව කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව තුල මෙම අතිරික්තය ඇති වී ඇත. 2025 සැප්තැම්බර් 08,09,10,11 දිනවල පැවති "පළාත් සභා කාර්ය මණ්ඩල සමාලෝචනය 2025" අනුව මෙම දෙපාර්තමේන්තුවට අදාල බඳවා ගැනීමට පවතින පුරප්පාඩු හා අතිරික්ත සංවර්ධන නිලධාරි තනතුරු 05ක් අනුමත කර ගැනීම සඳහා වාර්ථාවක් ප්‍රධාන ලේකම් මගින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමුකර ඇත.මේ වන විට එක් සංවර්ධන නිලධාරයකු ආයතන සංග්‍රහයේ Xii පරිච්ඡේදයේ 16 වන වගන්තිය ප්‍රකාරව 2026-02-28 දින සිට වැටුප් රහිත විදේශ නිවාඩු ලබාගෙන ඇත.
	ආයතනය පිළිබඳ මහජනයාට අවශ්‍ය තොරතුරු ලබාදීම සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කර පවත්වාගෙන ගොස් නොතිබුණි	මෙතෙක් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවට අදාල තොරතුරු පවත්වා ගෙන ගියේ සබරගමුව පළාත් සභා වෙබ් අඩවිය ඔස්සේය. ඉදිරියේදී අදාල අනුමැතිය හා ප්‍රතිපාදන වෙන් කොට ගෙන දෙපාර්තමේන්තුව මගින් වෙබ් අඩවියක් සකසා පවත්වාගෙන යාමට කටයුතු කරමි.
	ආයතනයේ පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවිය මගින් මහජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දී නොතිබුණි.	මෙතෙක් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවට අදාල තොරතුරු පවත්වා ගෙන යාම සඳහා වෙබ් අඩවිය නොපැවතුණි. එහෙත් මහජනයාට තොරතුරු දැනගැනීම හා පැමිණිලි ,ප්‍රසංශා ඉදිරිපත් කිරීමට " කර්මාන්ත දෙපාර්තමේන්තුව " නමින් FACE BOOK පිටුවක් යාවත්කාලීනව පවත්වාගෙන යනු ලැබේ.
	සැලසුම්ගත පුහුණු අවශ්‍යතා වලින් ලබාදී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% ට වඩා අඩු මට්ටමක පැවතුණි	2023 වසරේ සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට අඩු මට්ටමක පැවතුණි. 2023 වසරේ පුහුණු සැලැස්ම තුල පුහුණු වැඩසටහන් 17ක් ඇතුලත්ව තිබුණි.එම සැලැස්මට ඇතුලත් වුවද ප්‍රායෝගිකව පුහුණු වැඩසටහන් සියල්ල පැවැත්වීමට නොහැකි විය.2023 වසර තුල එම පුහුණු සැලැස්මට

		ඇතුලත්ව නොතිබූ පුහුණු වැඩසටහන් 11 ක් පැවැත්වීමට සිදුවිය. පවත්වන ලද මුලු පුහුණු වැඩසටහන් ගණන 14 කි. පුහුණු සැලැස්මෙන් බැහැරව වැඩසටහන් පැවැත්වීමට හේතු වූ කරුණු කිහිපයක් මෙසේ දක්වමි. •සමහර පුහුණු වැඩසටහන් සඳහා සම්පත්දායකයින් සොයා ගැනීමට ඇති වූ දුෂ්කර වීම, •සමහර පුහුණු වැඩසටහන් සඳහා ප්‍රතිපාදන වෙන් කර ගැනීමේ දී ප්‍රායෝගික ගැටළු ඇතිවීම, •වසර මැද දී පුහුණු අවශ්‍යතාවය වෙනස් වීම මත, පුහුණු සැලැස්මෙන් බැහැරව අදාළ පුහුණු වැඩසටහන් පවත්වීමට සිදුවීම වැනි කරුණු ප්‍රධාන වශයෙන් දැක්විය හැක. 2024 හා 2025 වසර වල සිට මේ දක්වා පුහුණු සැලැස්මට අදාලව පුහුණු වැඩසටහන් පැවැත්වීමට කටයුතු කර ඇත.
	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය යටත් මට්ටමේ/ව්‍යාවන මට්ටමේ/අභිතකර මට්ටමේ විය.	දෙපාර්තමේන්තුවේ 2023 වර්ෂ අවසාන ගිණුම් පිළිබඳව තත්වාගණනය කල මතයක් ලැබී තිබේ. එම මතයට පදනම් වූ 2018 මැයි 10 දිනැති අංක 265/2018 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ උපදෙස් පරිදි ඉදිරි වාර්ෂික ගිණුම් පිළියෙල කිරීම සිදු කර ඇත.
248	**ආයතනයේ නම : පළාත් මාර්ග අමාත්‍යාංශය**	
	පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් පළාත් සභා මුදල් රීති ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම මසකට වඩා වැඩි කාලයකට ප්‍රමාද කිරීම නිරීක්ෂණය විය.	පොදු තැන්පත් ගිණුමේ මාර්ග පළුදු, විගණන විමසුම් සඳහා නඩු පැවතීම , මූලික විමර්ශන පැවතීම ආදි කටයුතු නිසා ඇතැම් අවස්ථා වල පළාත් සභා මුදල් රීති ප්‍රකාරව කටයුතු කිරීමේ හැකියාවක් නොමැති වී ඇත. එම කටයුතු අවසන් වූ පසු කල් ඉකුත් වූ තැන්පත් නිරවුල් කිරීමට කටයුතු කරමි. අමාත්‍යාංශය යටතේ ඇති ආයතන වලට අදාල විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීමේදී විධායක ඉංජිනේරු කාර්යාල හරහා තොරතුරු ලබා ගෙන නි.ප්‍ර.ලේ. ඉංජිනේරු සේවා කාර්යාලය හරහා නිරීක්ෂණ නිරිදේශ ගෙන්වා ගෙන අමාත්‍යාංශය මඟින් සංශෝධන සිදු කලයුතු අවස්ථා ද

		පවතින බැවින්, එම අවස්ථා වලදී ප්‍රමාදයන් සිදුවිය හැක.හැකි සෑම විටම මසක් තුළ පිලිතුරු ලබා දීමට උත්සාහ කරමි.
	සමාලෝචිත වර්ෂය තුළ විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් නියමිත පරිදි පවත්වා නොතිබුණි	2024 හා 2025 වර්ෂ වලදී වර්ෂයකට කාර්තු 4 සඳහා බැගින් විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් 4 බැගින් නියමිත පරිදි පවත්වා ඇත.
	ඇතැම් වැය විෂයන් සඳහා සලසා තිබූ මුළු ප්‍රතිපාදනයම ඉතිරි කර තිබූ අවස්ථා නිරීක්ෂණය විය	ඇතැම් අවස්ථා වලදී ඇස්තමේන්තු සකස් කිරීමේදී අපේක්ෂිත තත්වයන් වෙනස් වීම මත මුළු ප්‍රතිපාදන ඉතිරිවීම් ඇති වන අවස්ථා පවතී. හැකිතාක් දුරට එම තත්වයන් මඟහරවා ගැනීමට කටයුතු කරමි.
	ඉල්ලා සිටිනු ලබන තොරතුරු ලබා නොදීම සම්බන්ධව ඉදිරිපත් වන පැමිණිලි ලේඛනගත කිරීම් හා ඒ සම්බන්ධයෙන් ගනු ලැබූ ක්‍රියාමාර්ග පැහැදිලි කරන ලේඛන පවත්වා නොතිබුණි.	ඉදිරිපත් වන පැමිණිලි හා යෝජනා යොමු කිරීමට අභ්‍යන්තර කටයුතු ඒකකය මඟින් පැමිණිලි පෙට්ටියක් සකසා ඇත. පැමිණිලි ලේඛනගත කිරීම සඳහා ආයතන අංශය මඟින් ලේඛනයක් නඩත්තු කරමින් පවති. ඒ අනුව ඉල්ලන තොරතුරු ලබා දීම සිදු කරයි.
	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය,යටත්ව මට්ටමේ/ව්‍යාවන මට්ටමේ/ අහිතකර මට්ටමේ විය.	ආයතනයේ ගිණුම් පිළිබඳ තත්ත්වාගණනය කළ මතය ලබා දී ඇත.ඉදිරියේදී ඉහත ගිණුම්කරණ අඩුපාඩු මඟහරවා ගනිමින් සකසන සත්‍ය හා සධාරණ මතයක් ගොඩනගා ගැනීමට උත්සාහ කරමි.
248	**ආයතනයේ නම : පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය**	
	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබීම	මේ වන විට නියමිත ආකෘති ප්‍රකාරව සකස් කර නියමිත දිනට අනුමත කර ඇත.
	විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම මසකට වඩා වැඩි කාලයකට ප්‍රමාද වීම	විගණන විමසුම් වල සඳහන් කර ඇති දිනය වන විට පිළිතුරු සැපයීමට අවශ්‍ය කටයුතු සිදුකරයි.

	වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ	පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛ 05/2024 යටතේ අදාල ණය ශේෂ කපාහැර ඇත.
	අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩලය බඳවා ගෙන තිබීම	පළාත් සභා අනුමත කාර්ය මණ්ඩලය තුළ බඳවා ගත් නිලධාරීන් සේවා අවශ්‍යතාවය මත මෙම ආයතනයට අනුයුක්ත කර ඇත
	සියළු නිලධාරීන් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබීම සහ වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබූ අදාළ නිලධාරීන් පිළිබඳව ආයතන ප්‍රධානියා විසින් උචිත බලධරයා දැනුවත් කර නොතිබීම	මේ වන විට සියළුම නිලධාරීන් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කිරීමට කටයුතු කරමින් පවතී
	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය යටත්ව මට්ටමේ / ව්‍යාවන මට්ටමේ / අහිතකර මට්ටමේ වීම	සියළුම නිලධාරීන් විසින් අමාත්‍යාංශයේ විගණන මතය ඉහළ නැංවීම සඳහා උපරිමයෙන් ක්‍රියා කරමින් සිටී.
249	**ආයතනයේ නම : පළාත් ආදායම් දෙපාර්තමේන්තුව**	
	හානි පිළිබඳ ලේඛනය නිසි පරිදි යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	2024 වර්ෂයේ යාවත්කාලීන කර ඇත. 2024 ඇඟයීමේදී ඊට ලකුණු ලබා දි ඇත.
	බැංකු සැසඳුම් ප්‍රකාශ නියමිත දිනයට පිළියෙල කර සහතික කර විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.	රට පුරා බැංකු ශාඛා වලින් කෙරෙන ගෙවීම් වලට අදාල ගෙවීම් පත්‍රිකා රැස් කිරීමේදි ගිණුම් වලට ලැබීමට කාලයක් ගත වන බැවින් මසක් ඇතුළත බැංකු සැසඳුම් සකස් කර ඉදිරිපත් කිරීම සඳහා ප්‍රධාන ලේකම්ගෙන් අවසර ලබා ගෙන ඇත.
	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මු.රෙ. ප්‍රකාරව මසක් තුළ නිරවුල් කර නොතිබුණි.	2024 වර්ෂයේදී ගැලපුම් කළ යුතු ශේස සම්බන්ධයෙන් නිවැරදිව කටයුතු කර ඇති අතර 2024 ඇඟයීමේදී ඊට ලකුණු ලබා දි ඇත.
	පළාත් මූල්‍ය රීති ප්‍රකාරව නිකුත් කළ	2023 න් පසු වර්ෂ වලදී තත්කාර්ය අතුරු අග්‍රිම දින 14 කට පෙර නිරවුල්

	තත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිමවී දින 14 ක් ඇතුළත නිරවුල් කර නොතිබුණි.	කර ඇත. 2024 ඇඟයීමේදී ඊට ලකුණු ලබා දී ඇත.
	අනුමත අග්‍රිම ගිණුම් ශේෂ පළාත් භාණ්ඩාගාරයේ පොත් සමඟ කාර්තුමය වශයෙන් සසඳනු ලබන අක්මුදල් සැසඳුම් ප්‍රකාශය නියමිත දිනට පෙර පළාත් භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කර නොතිබුණි.	අක්මුදල් සැසඳුම් ප්‍රකාශය 2024 වර්ෂයේ නියමිත දිනට පෙර භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කර ඇත.
	අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩල බඳවාගෙන තිබුණි.	පළාත් සභා අනුමත කාර්ය මණ්ඩලය තුළ බඳවා ගත් නිලධාරීන් සේවා අවශ්‍යතාව මත මෙම දෙපාර්තමේන්තුවට අනුයුක්ත කර ඇත. 2024 ඇඟයීමේදී ඊට ලකුණු ලබා දී ඇත.
	සියළු නිලධාරින් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි.	2024 වර්ෂයේ සියළු නිලධාරින් වත්කම් බැරකම් ප්‍රකාශ නියමිත දිනට පෙර ඉදිරිපත් කර ඇත.
	වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් නොකළ අදාළ නිලධාරීන් පිළිබඳව ආයතන ප්‍රධානියා විසින් උචිත බලධරයා දැනුවත් කර නොතිබුණි.	2024 වර්ෂයේ සියළුම නිලධාරීන් නියමිත දිනට වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර ඇත. මේ පිළිබඳ ප්‍රධාන ලේකම් දැනුවත් කර ඇත.
	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ / ව්‍යාවන මට්ටමේ / අහිතකර මට්ටමේ විය.	2024 සඳහා විකරණය නොකළ මතයක් ලැබී ඇත.

249	**ආයතනයේ නම : ප්‍රධාන ලේකම් කාර්යාලය**	
	මසක් තුළ අභ්‍යන්තර විගණන විමසුම් සඳහා පිළිතුරු නොසැපයූ අවස්ථා නිරීක්ෂණය විය.	අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ විසින් ප්‍රධාන ලේකම් අමතා නිකුත් කරන ලද ඇතැම් විගණන විමසුම් වෙනත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ආයතනයන්ට අදාල කරුණු සම්බන්ධයෙන් වන බැවින් එම ආයතනයන් වෙතින් පිළිතුරු ලබාදීමේදී ප්‍රමාදයන් සිදු වී ඇත.
	පළාත් මූල්‍ය රීති ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිම වී දින 14ක් ඇතුළත නිරවුල් කර නොතිබුණි.	පළාත් මූල්‍ය රීති ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම කාර්යය නිම වී දින 14ක් ඇතුළත අනිවාර්යයෙන්ම නිරවුල් කරන ලෙස අදාල ආයතන දැනුවත් කර ඇති අතර වර්තමානය වන විට කාර්යය නිම වී දින 14ක් ඇතුළත නිරවුල් වීම සිදු වේ.
	ඇතැම් වැය විෂයන් සඳහා සලසා තිබූ මුළු ප්‍රතිපාදනයම ඉතිරි කර තිබූ අවස්ථා නිරීක්ෂණය විය.	ඉදිරි වර්ෂ සඳහා ඇස්තමේන්තු පිළියෙළ කිරීමේදී එවැනි අඩුපාඩු නැවත සිදු නොවීමට කටයුතු කරන ලෙස අදාල ආයතන දැනුවත් කර ඇති අතර වර්තමානයේදී කාර්තුමය වශයෙන් සියලුම වැය විෂයයන් වල ප්‍රතිපාදන ඉතිරිය පිළිබඳව ප්‍රගතිය විමසා බලනු ලැබේ.
	වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.	වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ මේ වන විට නිරවුල් කර ඇති අතර වර්තමානයේදී එවැනි හිඟ ණය ශේෂ නොමැත.
250	**ආයතනයේ නම : ආණ්ඩුකාර කාර්යාලය**	
	ඇතැම් වැය විෂයයන් සඳහා සලසා තිබූ මුළු ප්‍රතිපාදනයම ඉතිරි කර තිබූ අවස්ථා නිරීක්ෂණය විය.	අවශ්‍යතාවයන් පැන නගින ආකාරය අනුව වියදම් දැරීම සඳහා මෙහි ඇතැම් වැය විෂය ප්‍රතිපාදන වෙන්කර ඇති අතර එවැනි අවශ්‍යතාවයන් ඇති නොවීමත් 03/2022 රාජ්‍ය වියදම් පාලන චක්‍රලේඛය අනුව රජයේ වියදම් හැකිතාක් පාලනය කිරීමත් හේතුවෙන් ප්‍රතිපාදන ඉතිරිවීම සිදුවී ඇත. ඉදිරි වර්ෂවලට අදාල වියදම් වඩාත් විශ්ලේෂනාත්මකව හඳුනාගෙන නිවැරදිව පුරෝකථනය කර අවශ්‍යතාවයන් සඳහා පමණක් ගැලපෙන පරිදි ඇස්තමේන්තු සකස් කරන ලෙස නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත.

	වාර්ෂික කාර්ය සාධන වාර්තාව නිසි පරිදි පළාත් සභාව වෙත ඉදිරිපත් කිරීම සඳහා කටයුතු ආරම්භ කර නොතිබුණි.	විගණනය විසින් පරීක්ෂා කරන අවස්ථාව වන විට විගණන මතය ලැබී නොතිබුණි. එබැවින් වාර්ෂික කාර්ය සාධන වාර්තාව පළාත් සභාව වෙත ඉදිරිපත් කළ පසුව විගණන මතය ලැබුණු විට එයද ඉදිරිපත් කර ඇත.
	සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම්ගතව නොතිබුණි.	කාර්යාලයේ සෑම තනතුරකටම, ශ්‍රේණියකටම අයත් නිලධාරීන් වසරකට වරක් කාර්ය සාධන ඇගයීම සම්පූර්ණ කරනු ලබයි. එහි නිලධාරීන් සිදුකරනු ලබන කාර්යයන්, සහභාගි වූ පුහුණු වැඩසටහන්, අපේක්ෂා කරනු ලබන පුහුණු අවස්ථාවන් යනාදිය ඇතුළත්වන අතර එහිදී අදාල නිලධාරියා හා ආයතන ප්‍රධානියා විසින් පරීක්ෂා කර බලා අත්සන් කරයි. එසේම රා.පරි.චක්‍රලේඛ අංක 02/2018(1) හි වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කිරීම තවදුරටත් අවශ්‍ය නොවේ යන්න සඳහන් වී ඇත.
250	**ආයතනයේ නම : පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව**	
	අභ්‍යන්තර විගණන විමසුම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	2024 වර්ෂයේ සිට අභ්‍යන්තර විගණන විමසුම් ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන යාම සිදු කර ඇත.
	ඇතැම් වැය විෂයන් සඳහා සලසා තිබූ මුළු ප්‍රතිපාදනයම ඉතිරි කර තිබූ අවස්ථා නිරීක්ෂණය විය.	ඉදිරි වර්ෂයට අදාළව පෙර වර්ෂයේ දී ඇස්තමේන්තු සකස් කිරීම් කටයුතු සිදු කිරීමේදී ආයතනය අපේක්ෂා කරන අවශ්‍යතාවයන් තවදුරටත් විධිමත්ව හඳුනාගනිමින් අවශ්‍ය ප්‍රතිපාදන වෙන්කර ගැනීමට අදාළ සැලසුම් සැකසීමට නිලධාරීන් දැනුවත් කර ඇති අතර, ඒ අනුව අදාළ කටයුතු කරනු ලබයි.
	සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම්ගතව නොතිබුණි.	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2018(I) ප්‍රකාරව වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කිරීම තවදුරටත් අවශ්‍ය නොවන බව දන්වා ඇති බැවින් එය ක්‍රියාත්මකව නොමැති නමුත් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/98, 08/98(i) හා 08/98(ii) මඟින් හඳුන්වා දී ඇති කාර්යය සාධන ඇගයීම් ආකෘතිපත්‍ර යොදාගනිමින් සමස්ථ කාර්ය මණ්ඩල නිලධාරීන්ගේ කාර්ය

		සාධන ඇගයීම අඛණ්ඩව හා විධිමත්ව වාර්ෂිකව සිදු කරනු ලබයි.
251	**ආයතනයේ නම : සමූපකාර සේවක කොමිෂන් සභාව**	
	මාසික ගිණුම් සාරාංශ පිළියෙල කර නියමිත දිනයට පෙර පළාත් භාණ්ඩාගාර දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර නොතිබුණි. සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. ඇතැම් වැය විෂයන් සඳහා සලසා තිබූ මුළු ප්‍රතිපාදනයම ඉතිරි කර තිබූ අවස්ථා නිරීක්ෂණය විය.	මාසික ගිණුම් සාරාංශ වර්තමානයේ නියමිත දිනට පෙර පිළියෙළ කර පළාත් භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කරනු ලැබේ. සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා වර්තමානයේ මාසිකව විගණකාධිපති වෙත ඉදිරිපත් කරනු ලැබේ. **<u>රජයේ සේවකයින් සඳහා දේපල ණය පොළී</u>** කාර්යාලයේ සිටින නිලධාරීන් සහ ස්ථාන මාරු ලැබ පැමිණිය හැකි නිලධාරීන් දේපළ ණය ලබා ගතහොත් එහිදී ගෙවීම් සිදු කිරීමට සිදු වන බැවින් ඇස්තමේන්තු සකස් කිරීමේ දී මෙම වැය විෂයය සඳහා 2023 වර්ෂයේදී රු.200,000.00 ක මුදලක් වෙන් කර තිබූ නමුත් නිලධාරීන් දේපළ ණය ලබා නොගත් බැවින් එකී ප්‍රතිපාදන ඉතිරිවිය. 2026 වර්ෂය සඳහා මෙම වැය විෂයට රු.50,000.00 ක ප්‍රතිපාදනයක් වෙන් කර ඇත. **<u>ගොඩනැඟිලි සහ සවි කිරීම</u>** වර්තමානයේ අවශ්‍යතාවය පරිදි වැය කර ඇත.
251	**ආයතනයේ නම : නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(ක්‍රමසම්පාදන) කාර්යාලය**	

	සෑම වාහනයක් සඳහාම ලොග් පොත් යාවත්කාලීන පදනමක් මත පවත්වා නොතිබුණි.	විෂයභාර නිලධාරීන් හා අධීක්ෂණ නිලධාරීන් මේ පිළිබඳ ව දැනුවත් කර මෙවැනි දුර්වලතා නැවත ඇති නොවීමට කටයුතු කර ඇත. ලොග් පොත් යාවත්කාලීන පදනමක් මත පවත්වා ගෙන යන්නේ ද යන්න නිරීක්ෂණය කිරීම සඳහා නිරන්තර අධීක්ෂණයක් සිදු කරන බව කාරුණිකව සඳහන් කරමි.
	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ / ව්‍යාවන මට්ටමේ / අභිතකර මට්ටමේ විය	ආයතනයේ ගිණුම් කටයුතු සම්බන්ධයෙන් සිදුවන සියලු දුර්වලතා මඟ හරවා ගැනීම සඳහා නිරන්තර අවධානයෙන් කටයුතු කරන ලෙස සියලුම විෂයභාර නිලධාරීන් හා අධීක්ෂණ නිලධාරීන් ලිඛිතව හා වාචිකව දැනුවත් කර ඇත. ඒ අනුව 2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දී එම උපදෙස් අනුව කටයුතු කළ අතර 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ ව විගණකාධිපති වාර්තාවෙන් සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන මතයක් ලැබී ඇති බව මෙයින් කාරුණිකව සඳහන් කරමි.
251	**ආයතනයේ නම: නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) කාර්යාලය**	
	අනුමත අග්‍රිම ගිණුම් ශේෂ පළාත් භාණ්ඩාගාරයේ පොත් සමග කාර්තුමය වශයෙන් සසඳනු ලබන අක්මුදල් සැසඳුම් ප්‍රකාශය නියමිත දිනට පෙර පළාත් භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කර නොතිබුණි.	අනුමත අග්‍රිම ගිණුම් ශේෂ පළාත් භාණ්ඩාගාරයේ පොත් සමඟ කාර්තුමය වශයෙන් සසඳනු ලබන අක්මුදල් සැසඳුම් ප්‍රකාශය නියමිත දිනට පෙර පළාත් භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කරන ලෙස නිලධාරීන් දැනුවත් කර ඇති අතර වර්තමානය වන විට මාසිකව ලෙජර් සැසඳීමේ කටයුතු සිදු කර පළාත් භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කරනු ලැබේ.
280	**ආයතනයේ නම : සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ අධිකාරිය**	

	සමාලෝචිත වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශ නියමිත දිනට ඉදිරිපත් කර නොතිබුණි.	2025 වසරේ මූල්‍ය ප්‍රකාශ නියමිත පරිදි ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත.
	විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම මසකට වඩා වැඩි කාලයකට ප්‍රමාද කිරීම් නිරීක්ෂණය විය.	මේ වන විට පමාවීමකින් තොරව විගණන විමසුම් සඳහා පිළිතුරු ලබා දේ.
	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්තතා, ඌණතා පිළිබඳව වන නිර්දේශ ද අනෙකුත් නිර්දේශ ද නියමිත කාල වකවානුව තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.	භාණ්ඩ සමීක්ෂණයෙන් අපහරණය කිරීමට නිර්දේශ කරන ලද භාණ්ඩ ආදිය අපහරණය කිරීම වැනි නිර්දේශ ක්‍රියාත්මක කරනු ලබයි.
	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	විගණකාධිපති වෙත සියළුම වාර්තා නිසි ලෙස ඉදිරිපත් කරනු ලබයි.
	සෑම වාහනයක් සඳහාම ලොග් පොත් යාවත්කාලීන පදනමක් මත පවත්වාගෙන නොතිබුණි.	ලොග් සටහන් පොත් යාවත්කාලීන කර පවත්වාගෙන යනු ලබයි.
	බැංකු සැසඳුම් ප්‍රකාශ නියමිත දිනයට පිළියෙල කර,සහතික කර විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.	සෑම මසකම 15 දිනට සකස් කර විගණනය වෙත ඉදිරිපත් කරනු ලබයි.
	ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන නොතිබුණි.	ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන යනු ලබයි.
	අභ්‍යන්තර විගණන විමසුම් ලේඛනය	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යනු ලබයි.

	යාවත්කාලීනව පවත්වාගෙන නොතිබුණි.	
	අධිකාරියට අදාළව ප්‍රඥප්ති අනුව මූල්‍ය හා පරිපාලන නීති පිළියෙල කර නොතිබුණි.	අධිකාරියට ස්වාධීන වූ මූල්‍ය සහ පරිපාලන නීති පිලියෙල කරන තෙක් සබරගමුව පළාත් සභාවේ මූල්‍ය හා පරිපාලන නීති අනුගමනය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සහිතව කටයුතු කර ඇත.
	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව 2018.08.01 දිනෙන් පසුව සියළුම අභ්‍යන්තර විගණන වර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තුමේන්තුව වෙත ඉදිරිපත් කර නොතිබුණි.	නිසි පරිදි සියළුම වාර්තා වල පිටපත් ලබාදීමට පියවර ගෙන ඇත.
	පළාත් මූල්‍ය රීති ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	නිසි පරිදි සියළුම වාර්තාවල පිටපත් ලබාදීමට පියවර ගෙන ඇත.
	ප්‍රතිපාදන සීමාව ඉක්මවා වියදම් දැරීමට සිදුව තිබුණි.ඇස්තමේන්තුගත වියදම වර්ෂයේදී උපයෝජනය කළ පසු ඉදිරිය ඉක්මවන පරිදි බැරකම් වලට එළඹ තිබිණ.	පෙර වසරවල ආදායම් සහ වියදම් සැළකිල්ලට ගෙන අයවැය සකස් කරන බැවින් ඇස්තමේන්තු ගත වියදම තුල වියදම් කළමනාකරණය කරනු ලබයි.
	ඇතැම් වැය විෂයන් සඳහා සලසා තිබූ ප්‍රතිපාදනයම ඉතිරි කර තිබූ අවස්ථා නිරීක්ෂණය විය.	අප අධිකාරිය ආදායම් උත්පාදනය කරන ආයතනයක් වන බැවින් අධිකාරියේ මූල්‍ය තත්ත්වය කළමනාකරණය කිරීමේ දී වෙන් කරනු ලබන ප්‍රතිපාදන වියදම් කිරීමේ ගැටළු පැන නැගී ඇති බැවින් මෙම තත්ත්වය පැන නැගී ඇත.
	වර්ෂයකට වඩා වැඩි කාලයක සිට	මෙහි කල් ඉකුත් වී ඇති ණය ශේෂ අය කර ගැනීම සඳහා කමිටු

	පැවත එන ණය ශේෂ පැවතුණි.	කීහිපයක් පත් කර ඇති අතර සමහර ආයතන සමඟ සාකච්ජා කර අය කිරීම් සිදු කර ගෙන ඇත. පෞද්ගලික අංශයේ ආයතනයක් මඟින් අය කර ගැනීම් සිදු කිරීමට අධිකරණ කටයුතු ආරම්භ කර ඇත. එසේ අය කර ගැනීමට නොහැකි ශේෂයන් සම්බන්ධයෙන් තීරණ ගැනීමට හානි පූර්ණ කමිටු පත් කිරීමට කටයුතු යොදා ඇත
	පළාත් මූල්‍ය රීති ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා තත්කාර්යය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි.	2023,2024 සහ 2025 වර්ෂවල එවැනි අග්‍රිම නිකුත් කර නොතිබුණි.
	ඉල්ලා සිටිනු ලබන තොරතුරු ලබා නොදීම සම්බන්ධව ඉදිරිපත් වන පැමිණිලි ලේඛනගත කිරීම හා ඒ සම්බන්ධයෙන් ගනු ලැබූ ක්‍රියා මාර්ග පැහැදිලි කරන ලේඛන පවත්වා නොතිබුණි.	අවශ්‍ය අවස්ථාවල තොරතුරු ලබාදීමට කටයුතු කරනු ලබයි.
	2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධි විධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.	මේ වන විට මානව සම්පත් සැලැස්ම සකස් කර ක්‍රියාවට නංවමින් පවතී.
	සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මඟින් කාර්ය මණ්ඩලයෙන් සියයට 50 කට වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක්	ඉලක්ක ගත පැය 12 සපුරා ගැනීමට 2024,2025 සහ 2026 වර්ෂවල නිරන්තර පුහුණු වැඩසටහන් සඳහා සහභාගී කරවීම් සිදු කර ඇත.

	සහතික කර නොතිබුණි.	
	සමස්ථ කාර්යය මණ්ඩලයට ඇතුලත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම්ගතව නොතිබුණි.	ඉදිරියේදී සකස් කිරීමට කටයුතු කර ඇත.
	මානව සම්පත් සැලැස්ම සකස් කිරීමට ද ධාරිතා හා නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ආයතනය තුළ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු නම් කර නොතිබුණි.	සහකාර අධ්‍යක්ෂ(පාලන) නම් කර ඇත. ඒ සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් ඇත.
	සැලසුම්ගත පුහුණු අවස්ථා වලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% ට වඩා අඩු මට්ටමක පැවතුණි.	ඉලක්කගත පුහුණු අවස්ථා ලබාදම සඳහා කටයුතු කරමින් පවතී.
	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ/ව්‍යාවන මට්ටමේ/අභිතකර මට්ටමේ විය.	2024 සහ 2025 වසරේ විගණන මතය වූවේ සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බවයි.
	පළාත් ගිණුම් පිළිබඳ කාරක සභාවේ නිර්දේශ/නියෝග ක්‍රියාත්මක කර නොතිබුණි.	මේ වන විට එම නිර්දේශ /නියෝග ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ඇත.
	වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් නොකළ අදාළ නිළධාරීන් පිළිබඳව ආයතන ප්‍රධානියා විසින් බලධරයා දැනුවත් කර නොතිබුණි.	අදාළ නිළධාරීන් දැනුවත් කර වත්කම් බැරකම් ප්‍රකාශ ලබාගෙන ඇත.
	නිළධාරීන්ගෙන් රජයට හෝ පළාත් සභාවට සිදු වූ පාඩු පූර්ණය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.	මෙම පාඩු පූර්ණය කර ගැනීම සඳහා සිදු කරනු ලබන පරීක්ෂණ කටයුතු මේ වන විටත් නිම වී නොමැත.

281	**ආයතනයේ නම : මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය**	
	අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩලය බඳවාගෙන තිබුණි.	පළාත් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව මඟින් අංක අවිඅ/258102505 දරණ විගණන විමසුම (සබරගමුව පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය මානව සම්පත් කළමනාකරණ හා නිලධාරීන් ස්ථානගත කිරීම සම්බන්ධ විශේෂ අභ්‍යන්තර විගණන පරීක්ෂණය -2025) මගින් අධිකාරියේ අනුමැතියකින් තොරව බඳවා ගැනීම් හා උසස් කිරීම් සම්බන්ධවපරීක්ෂණයක් පවත්වන ලෙස 2025.09.17 දිනැති අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කර ඇත.(ඇමුණුම අංක 01) ඒ අනුව 2025.10.21 දින ප්‍රධාන අමාත්‍යාංශ ලේකම් වෙත මේ සඳහා පරීක්ෂණ මණ්ඩලයක් පත් කර දෙන මෙන් ලිඛිතව ඉල්ලීමක් සිදුකරන ලදී. පරීක්ෂණ මණ්ඩලයක් පත්කර ගැනීම සම්බන්ධව ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්ගේ අංක CM/AD/10/10 දරණ 2025.12.10 දිනැති ලිපිය මඟින්,(ඇමුණුම් අංක 02) පළාත් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව මඟින් මාර්ග බලපත්‍ර නිකුත් කිරීමට අදාල විශේෂ අභ්‍යන්තර විගණන පරීක්ෂණය, 2025.07.15 දිනැති අංක අවිඅ/108102504 දරණ විගණන විමසුම සම්බන්ධයෙන් සිදු කරන පරීක්ෂණ මණ්ඩලයටම, අනුමැතියකින් තොරව බඳවා ගැනීම් සම්බන්ධ පරීක්ෂණය භාර දෙන ලෙස අධිකාරියට ලිඛිතව දැනුම් දී ඇත. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව අප ආයතනයට යොමුකර ඇති මානව සම්පත් කළමනාකරණය හා නිළධාරීන් ස්ථානගත කිරීම් සම්බන්ධව යොමු කර ඇති අවිඅ/258102505 අංක දරණ විශේෂ අභ්‍යන්තර විගණන විමසුම සම්බන්ධයෙන් පමණක් පරීක්ෂණයක් පැවැත්වීමට සුදුසු නිළධාරීන්ගෙන් යුතු පරීක්ෂණ මණ්ඩලයක් කඩිනමින් පත්කරදෙන මෙන් නැවතත් එනම් 2026.01.05 දින ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්ගෙන් ඉල්ලීමක් කරන ලදී. (ඇමුණුම් අංක 03)2026.01.14 දින ප්‍රධාන අමාත්‍යාංශ ලේකම් මඟින් ඉහත සඳහන් විගණන විමසුම සම්බන්ධව පරීක්ෂණ මණ්ඩලයක් පත්කරන ලදී. (ඇමුණුම් අංක 04) කිහිප අවස්ථාවකදීම කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අතිරික්ත සේවකයින් අනුමත කර ගැනීමට උත්සහ දැරුවත් එය අසාර්ථක විය. නමුත් 2026.03.09 දිනත් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අතිරික්ත සේවකයින් අනුමත කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර දෙන ලෙස ප්‍රධාන අමාත්‍යාංශයට ලිඛිතව දැනුම් දීම් සිදු කරත්, නැවත ගොණු වල අඩුපාඩු පැවතීම හේතුවෙන් එය ද නිවැරදි කර එවන ලෙස අධිකාරියට ලිඛිතව දන්වා ඇති බව කාරුණිකව දන්වමි. (ඇමුණුම් අංක 05) වර්ථමානය වන විට සබරගමුව මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ අනුමත සේවක 118 අමතරව අතිරික්ත සේවකයින් 28 රාජකාරියේ නියුතු වේ. 2017.05.29 දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් කාර්ය මණ්ඩලය අනුමත කරන අවස්ථාවේදි සේවකයින් 189 දෙනෙකු

		සේවයේ යෙදුන අතර එයින් 42 ක් මේ වන විට සේවයෙන් විශ්‍රාම ගොස් ඇති අතර පවත්නා කාර්ය මණ්ඩලය පවතින රාජකාරි ඉටුකර ගැනීමට අපහසු බවද දන්වා සිටිමි.
	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්තතා, ඌණතා පිළිබඳව වන නිර්දේශ ද නියමිත කාල වකවානු තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.	2025 භාණ්ඩ සමීක්ෂණයේදී අදාළ ඌණතා හා අතිරික්ත ගැලපීමට කටයුතු කිරිම. ඉන්වෙන්ට්‍රි නිසි පරිදි පවත්වා ගෙන නොමැති වීම නිසා විෂය නිලධාරින් වෙනස් කර විෂය දැනුම පවතින නිළධාරින් පත්කිරිම.
	වාහන අනතුරු සම්බන්ධයෙන් පළාත් මූල්‍ය රීති අනුව කටයුතු නොකල අවස්ථා විය.	මේ වන විට පළාත් මූල්‍ය නිතිරිති අනුව කටයුතු කර වාහනයේ අළුත් වැඩියා කටයුතු අවසන් කර ඇති අතර වාහනය සම්බන්ධයෙන් පැවති කමිටුවේ තීරණය අනුව රක්ෂණයෙන් ආවරණය නොවූ රු.594,200.00 ක් වූ අලාභය රියදුරු මහතාගෙන් වාරික 60 අයකර ගැනීමට කටයුතු කිරිම. 2026 මැයි මස වන විට අය කර ගැනීම රු.69,341.00 අයකර ගෙන තිබීම.
	පළාත් මූල්‍ය රිති ප්‍රකාරව ආයතනය තුළ මූල්‍ය බලතල පැවරීමක් සිදු කර නොතිබුණි.	2025,2026 වර්ෂයේ පළාත් මූල්‍ය රීති ප්‍රකාරව ආයතනය තුළ මූල්‍ය බලතල පවරා ඇත. (ඇමුණුම් අංක 06)
	මූල්‍ය බලතල පැවරීම ප්‍රමාණවත් පරිදි ආයතනය තුළ සන්නිවේදනය කර නොතිබුණි.	2025,2026 වර්ෂයේ පළාත් මූල්‍ය රීති ප්‍රකාරව ආයතනය තුළ මූල්‍ය බලතල පැවරීම සන්නිවේදනය කර ඇත.(මූල්‍ය බලතල පැවරීම දුටු බවට නිලධාරින් අත්සන් කර ඇත) (ඇමුණුම් අංක 06)
	මූල්‍ය බලතල පැවරීමේදී සෑම ගණුදෙනුවක්ම අවම වශයෙන් නිලධාරීන් දෙදෙනෙකුගේ පරීක්ෂාවට ලක්වන පරිදි බලතල පවරා නොතිබුණි.	2025 වර්ෂයේ සිට මූල්‍ය බලතල පැවරීමේදී සෑම ගණුදෙනුවක්ම අවම වශයෙන් නිලධාරීන් දෙදෙනෙකුගේ පරීක්ෂාවට ලක්වන පරිදි රාජකාරි නිළධාරින්ට පවරා ඇත.
	අධිකාරියට අදාලව ප්‍රඥප්ති අනුව	ප්‍රඥප්ති ප්‍රකාරව මූල්‍ය හා පරිපාලන නීති පිලියෙල කර අනුමත කර

	මූල්‍ය හා පරිපාලන නීති පිළියෙල කර නොතිබුණි.	ගැනීමට පළාත් සභාවක් පැවතිය යුතු අතර නමුත් මේ වන විටත් සබරගමු පළාත් සභාවක් පිහිටුවා නැත. නමුත් ප්‍රඥප්තියේ සඳහන්ව ඇති 35 වන වගන්තිය ප්‍රකාරව 1991 අංක 37 දරණ ජාතික ගමනා ගමන කොමිෂන් සභා පනතට යටත් වේ. එහි තිබෙන නිතීරීති අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සමඟ අධිකාරියට යොදා ගනී. ආයතන සංග්‍රාහය හා මූල්‍ය රිති සංග්‍රාහය අධිකාරියට අධ්‍යක්ෂ මණ්ඩලය මඟින් අනුමත කර ගැනීම. (ඇමුණුම් අංක 07) වර්ථමානය වන විට සබරගමුව මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ අනුමත සේවක 118 අමතරව අතිරික්ත සේවකයින් 28 රාජකාරියේ නියුතු වේ. 2017.05.29 දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් කාර්ය මණ්ඩලය අනුමත කරන අවස්ථාවේදි සේවකයින් 189 දෙනෙකු සේවයේ යෙදුන අතර එයින් 42ක් මේ වන විට සේවයෙන් විශ්‍රාම ගොස් ඇති අතර පවත්නා කාර්ය මණ්ඩලය මගින් පවතින රාජකාරි ඉටුකර ගැනීමට අපහසු බවද දන්වා සිටිමි.
	වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම පිළියෙල කර නොතිබුණි.	2026 වර්ෂයේ සිට සකස් කර ඇත. (ඇමුණුම් අංක 08)
	විගණකාධිපති විමසා අභ්‍යන්තර විගණන වැඩසටහන වර්ෂය ආරම්භයේදී පිළියෙල කර නොතිබුණි.	2025 වර්ෂයේ ආරම්භයේ සිට මේ දක්වා සෑම කාර්තුවකට විගණන හා කළමනාකරණ කම්ටු රැස්වීම් පවත්වනු ලබයි.
	අභ්‍යන්තර විගණන විමසුම් සඳහා පිළිතුරු නොසැපයූ අවස්ථා වාර්තා විය.	2025 වර්ෂයේ සිට නියමිත දිනට විගණන විමසුම් වලට පිළිතුරු සපයා ඇති අතර විගණන විමසුම් සඳහා නිර්දේශ ක්‍රියාත්මක කර පිළිතුරු සැපයිමට නියමිතව පවතී නම් ඒ සඳහා අතුරු පිළිතුරක් මගින් කාලය ඉල්ලා නියමිත දිනය විගණන විමසුම් වලට පිළිතුරු ලබා දි ඇත.
	2018 අංක 19 දරන ජාතික පනතේ 40(4) උප වගන්ති ප්‍රකාරව 2018.08.01 දිනෙන් පසුව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර නොතිබුණි.	සබරගමුව පළාත් සභාවේ සියළුම විගණන කටයුතු සිදු කරන්නේ පළාත් සභාවේ අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව මඟිනි. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව මඟින් අප අධිකාරියේ අභ්‍යන්තර විගණන වාර්ථා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව වෙත යොමු කරනු ලැබේ.

	පළාත් මූල්‍ය රීති ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	සබරගමුව පළාත් සභාවේ සියළුම විගණන කටයුතු සිදු කරන්නේ පළාත් සභාවේ අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව මඟිනි. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව මඟින් අප අධිකාරියේ අභ්‍යන්තර විගණන වාර්ථා වල පිටපත් විගණකාධිපති වෙත යොමු කරනු ලැබේ.
	ප්‍රතිපාදන සීමාව ඉක්මවා වියදම් දැරීම සිදුව තිබුණි.	2026 වර්ෂයේ සිට ප්‍රතිපාදන ඉක්මවා වියදම් දැරීම අධ්‍යක්ෂ මණ්ඩලය මඟින් තීරණය ගැනීමට නියමිතය.
	ඇස්තමේන්තුගත වියදම් වර්ෂයේදී උපයෝජනය කළ පසු ඉතිරිය ඉක්මවව පරිදි බැරකම්වලට එළඹ තිබුණි.	මෙසේ නොවීමට ගණකාධිකාරිට ලිඛිතව දැනුවත් කර ඇත.(ඇමුණුම් අංක 09)
	පළාත් මූල්‍ය රීති ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි.	2026 සිට මූල්‍ය සීමාවන්ට අනුව කටයුතු කිරීම.
	ආයතනයේ පුරවැසි /සේවාලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය කිරීමට හෝ ඇගයුමට භාජනය කිරීමට ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.	මහජන පැමිණිලි හා අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා දී ඇති අතර සේවා කාර්යක්ෂමතා මැනීම සඳහා සුදුසු ක්‍රමවේදයක් 2026 වර්ෂය අවසානයේ දී සකස් කිරීමට කටයුතු කරමි.
	සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර නොතිබුණි.	2026 වර්ෂයේ අවසානයේ සිට ගිවිසුම් සකස් කර ඉදිරියට ක්‍රියාත්මක කිරීමට කටයුතු කරමි.
	සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය	අධිකාරියේ රියදුරු, කොන්දොස්තර හා සම්බන්ධ සැලසුම් ගත පුහුණු ප්‍රමාණය සඳහා පුහුණු වැඩසටහන් ලබා දීමට නොහැකි වී ඇති අතර

	50%ට වඩා අඩු මට්ටමක පැවතුණි.	ආයතනයේ සියලු නිලධාරීන් සම්බන්ධ පුහුණු වැඩ සටහන් සිදු කිරීමට කටයුතු කර ඇති බැවින් මෙම අඩුපාඩු ඉදිරියෙදී 2027 වර්ෂ නිවැරදි කර ගැනීමට කටයුතු කරමි.
	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය,යටත්ව මට්ටමේ/ව්‍යාවන මට්ටමේ /අභිතකර මට්ටමේ විය.	2024.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාව අනුව තත්ත්වාගණනය කළ මතයක් ලබා දී ඇත.
	ආයතනය විසින් ඉටුකරනු ලබන කාර්ය භාර්ය හා සම්බන්ධිතව ප්‍රධාන කාර්ය දර්ශක 03ක් හඳුනාගෙන නොතිබුණි.	කාර්ය සාධන දර්ශක හඳුනා ගැනීමට කටයුතු කිරිම.
	සියළුම නිලධාරීන් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි.	2025 වර්ෂයේ අල්ලස් හා දූෂණ කොමිෂන් සභාවට සියළුම මාණ්ඩලික නිළධාරීන්ගේ වත්කම් බැරකම් ප්‍රකාශ භාර දි ඇති අතර 2026 වර්ෂයේ සියළුම මාණ්ඩලික නිළධාරීන්ගේ වත්කම් බැරකම් ප්‍රකාශ 2026 ජුනි 31 පෙර යොමු කිරීමට කටයුතු කරමි.
	වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් නොකළ අදාල නිලධාරීන් පිලිබඳව ආයතන ප්‍රධානියා විසින් උචිත බලධරයා දැනුවත් කර නොතිබුණි.	2026.06.30 පෙර සියළුම මාණ්ඩලික නිළධාරීන්ට වත්කම් බැරකම් ප්‍රකාශ ලබා දෙන ලෙස ලිඛිතව දැනුම් දි ඇත. (ඇමුණුම් අංක 10)
281	**ආයතනයේ නම : කර්මාන්ත සංවර්ධන අධිකාරිය**	
	සමාලෝචිත වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශ නියමිත දිනට ඉදිරිපත් කර නොතිබුණි.	මේ වන විට නියමිත දිනට මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම සිදු කරයි
	අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩල බඳවාගෙන තිබුණි	කර්මාන්ත සංවර්ධන අධිකාරිය සතුව අනුමත කාර්යය මණ්ඩලයක් නොමැති අතර, අවශ්‍යතාව අනුව බලවින්න පෙරනිමි කොන්ක්‍රිට් අංගනයේ සහ වෙරළුප අත්කම් මැදුර සඳහා අනියම් පදනමින් සේවකයන් බඳවා ගෙන කටයුතු පවත්වාගෙන යයි. කර්ය මණ්ඩලය අනුමත කර ගැනීම සඳහා 2025.09.10 දින

		කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීමක් ඉදිරිපත් කර ඇතත් මෙතෙක් ඒ සඳහා අනුමැතිය ලැබී නොමැත.
